අ.පො.ස. (උ.පෙළ) විභාගය

# ඇගයීම් වාර්තාව

# 2021

## 29 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස (උ.පෙළ) විභාගය - 2021

# ඇගයීම් වාර්තාව

# 29 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි**

**අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2021**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය**

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ<br>විභාග කොමසාරිස් ජනරාල් |
| සැලසුම හා සංවිධානය | : | ඩබ්. එස්. ඩී. වීරසිංහ<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| විෂය සම්බන්ධීකරණය | : | ඒ. දිලීප ධර්මසේන<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| **අන්තර්ගතය සංවර්ධනය සඳහා**<br>විෂයපාදක මඟ පෙන්වීම | **:** | මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| **ශාස්ත්‍රීය මඟ පෙන්වීම** | **:** | ඩබ්. එස්. ඩී. වීරසිංහ<br>විභාග කොමසාරිස්<br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස් (විශ්‍රාමික)<br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| | | ඒ. දිලීප ධර්මසේන<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| අන්තර්ගත සංවර්ධන කමිටුව | : | එම්. ඩී. එස්. කුලතුංග<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ<br>අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන<br>අමාත්‍යාංශය |
| | : | එම්. ඒ. අමාලි යසින්තා<br>ගුරු උපදේශක (රා.ආ)<br>උතුරු කොළඹ අධ්‍යාපන කොට්ඨාසය |
| | : | |

| | | |
|---|---|---|
| | : | පී. ඒ. කේ. මලලසේකර<br>ශ්‍රී. ලං. ගු.සේ.<br>දේවි බාලිකා ජාතික පාසල<br>දොම්පේ. |
| | : | කේ. ඒ. එන්. ප්‍රියංගනී<br>ශ්‍රී. ලං. ගු. සේ.<br>සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය<br>කොළඹ 08 |
| | : | ටී. පී. ටී. එන්.පෙරේරා<br>ශ්‍රී. ලං. ගු. සේ.<br>නු/ශ්‍රී සේනානන්ද මහා විද්‍යාලය<br>මීපිළිමාන |
| | : | ඒ. එම්. ඒ. බී. අබේසිංහ<br>ශ්‍රී. ලං.ගු. සේ.<br>ශාන්ත තෝමස් විද්‍යාලය<br>මාතලේ |
| | : | එච්. යූ. හේමන්ති රෙජිනෝල්ඩ්<br>ශ්‍රී. ලං. වි. සේ.<br>පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය<br>පිළියන්දල |
| ලේඛන කළමනාකරණ සහාය | : | ඒ. අයි. පී. අකුරුගොඩ<br>කළමනාකරණ සේවා නිළධාරි |
| පරිගණක පිටපත් සැකසුම | : | ඒ. අයි. පී. අකුරුගොඩ<br>කළමනාකරණ සේවා නිළධාරි |
| පිටකවර සැකසුම | : | ඒ. එල්. කේ. චතුරාණි<br>කළමනාකරණ සේවා නිළධාරි |

## විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ 2024 වර්ෂයේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයයට අදාළව මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කර ඇත්තේ අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ දත්තමය හා විශ්ලේෂණාත්මක අවබෝධයක් ලබා දීම, ඔවුන්ගේ ශක්තීන් හා දුර්වලතා හඳුනා ගැනීම සහ එම අනාවරණයන් පදනම් කරගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මෙන්ම පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ අරමුණ පෙරදැරිව ය.

මෙම වාර්තාවේ, විෂය නිර්දේශයේ අපේක්ෂිත ඉගෙනුම් නිපුණතා හා ඉගෙනුම් ඵල අනුව අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇත. ඒ අනුව එක් එක් පරීක්ෂණ අයිතමය සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර, ශක්තීන් හා දුර්වලතා මෙන් ම වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ඒ සඳහා සුදුසු අධ්‍යාපන යෝජනා ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව ගුරුවරුන්, පාසල් පරිපාලකයන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකයන්, සිසුන් සහ දෙමාපියන් ඇතුළු අධ්‍යාපන පද්ධතියේ සියලු ම පාර්ශ්වකරුවන් සඳහා වැදගත් ලේඛනයකි. වාර්තාවේ අන්තර්ගත, විශ්ලේෂණ මඟින් ගුරුවරුන්ට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දුර්වලතා නිවැරදිව හඳුනාගෙන ඉලක්කගත ඉගැන්වීම් ක්‍රමෝපායන් සැලසුම් කිරීමට හැකි වන අතර, සිසුන්ට තම ඉගෙනුම් අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව සූදානම් වීමට මඟ පෙන්වයි. එමෙන් ම විෂයමාලා සංශෝධනය, ගුරු වෘත්තීය සංවර්ධනය, සම්පත් වෙන් කිරීම සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ද මෙම වාර්තාව ඉවහල් වනු ඇත.

මෙම වාර්තාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා, අපේක්ෂකයන්ගේ සාධන දත්ත සමඟ එක් එක් පරීක්ෂණ අයිතමයට අදාළ විශ්ලේෂණ, නිරීක්ෂණ සහ නිර්දේශ ඒකාබද්ධව අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. එමඟින් සිසුන් මුහුණ දෙන සංකල්පමය දුර්වලතා සහ ඉගෙනුම් අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන ඒ සඳහා සුදුසු මැදිහත්වීම් සැලසුම් කළ හැකි වනු ඇත. තවද, මෙම වාර්තාව ඉදිරි වසරවල අපේක්ෂකයන්ගේ සාධනය සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීම සඳහා දත්ත පදනමක් ලෙස ද භාවිත කළ හැකිය.

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා දත්ත මත පදනම් වූ තීරණ ගැනීම අත්‍යවශ්‍ය වන බැවින්, මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති අනාවරණයන් සහ නිර්දේශ ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ගුරුවරුන් සහ සිසුන් විසින් ප්‍රායෝගිකව භාවිතයට ගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට දායක කර ගනු ඇතැයි මම විශ්වාස කරමි.

අවසාන වශයෙන්, මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කිරීම සඳහා කැපවීමෙන් දායක වූ සියලු ම සම්පත්දායකයන්ට සහ විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ නිලධාරීන්ට මාගේ හෘදයංගම ස්තූතිය පුද කරමි. විශේෂයෙන් ම විද්‍යාත්මක ප්‍රවේශයකින් මෙම වාර්තාව සම්පාදනය කිරීම සඳහා ඔවුන් දැක්වූ වෘත්තීමය දායකත්වය ඉතා අගය කොට සලකමි.

ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ

විභාග කොමසාරිස් ජනරාල්

## සංක්ෂිප්තය

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ 2024 වර්ෂයේ සන්නිවේදය හා මාධ්‍ය අධ්‍යයනය විෂයයට අදාළව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද මෙම ඇගයීම් වාර්තාව, අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ප්‍රකාශනයකි. මෙම වාර්තාව ගුරුවරුන්, විෂයභාර නිලධාරීන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පර්යේෂකයන්, සිසුන් සහ දෙමාපියන් සඳහා ප්‍රයෝජනවත් ලේඛනයක් ලෙස භාවිත කළ හැකි ය.

මෙම වාර්තාව ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.

**පළමු කොටසෙහි**, සන්නීවේදය හා මාධ්‍ය අධ්‍යයනය විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන්ගේ සාමාන්‍ය තොරතුරු, මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව අපේක්ෂක සංඛ්‍යාව, දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප අනුව සාධනය, ශ්‍රේණි ව්‍යාප්තිය සහ අනෙකුත් සංඛ්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත. එමෙන්ම විෂය අරමුණු, ඇගයීම් රාමුව සහ විභාගයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද ලබා දී ඇත.

**දෙවන කොටසෙහි**, I පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි I පත්‍රයේ ව්‍යුහය, ප්‍රශ්න සැකැස්ම, ලකුණු ලබාදීමේ පටිපාටිය සහ එක් එක් ප්‍රශ්නයට අපේක්ෂකයන් දැක්වූ ප්‍රතිචාර පිළිබඳ දත්තමය විශ්ලේෂණ ද අන්තර්ගත වේ. තව ද, අයිතමවල පහසුතාව/පහසුතා දර්ශක, විභේදන හැකියාව සහ අපේක්ෂකයන්ගේ සාමාන්‍ය ප්‍රතිචාර රටා ද විග්‍රහ කර ඇත.

**තෙවන කොටසෙහි**, II පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි එක් එක් ප්‍රශ්නය, එහි කොටස් හා අනුකොටස් සඳහා අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇති අතර, අයිතමවල පහසුතා දර්ශක, නිපුණතා මට්ටම් සහ සංකල්පමය දුර්වලතා හඳුනාගෙන ඇත. එසේම, එම අනාවරණයන් මත පදනම්ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී ලෙස සංවිධානය කිරීම සඳහා සංවර්ධනාත්මක යෝජනා ද ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව සකස් කිරීම සඳහා සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory - CTT) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory - IRT) යන විද්‍යාත්මක ප්‍රවේශයන් යොදාගෙන අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය කර ලබාගත් දත්ත භාවිත කර ඇත. මීට අමතරව පිළිතුරු පත්‍ර ඇගයීමේ කටයුතුවල නිරත වූ ප්‍රධාන පරීක්ෂකවරුන්, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන් සහ සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ, අදහස් සහ යෝජනා ද මෙම වාර්තාව සකස් කිරීම සඳහා පාදක කරගෙන ඇත.

මෙම වාර්තාවේ ඇතුළත් විශ්ලේෂණයන් සහ නිර්දේශ, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, විෂය සාධනය ඉහළ නැංවීම, විෂයමාලා සංවර්ධනය සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

# පටුන

I කොටස

1.0 විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු 01

1.1 විෂය අරමුණු 01

1.2 අපේක්ෂකයන්ගේ විෂයය සාධනය පිළිබඳ තොරතුරු 02

1.2.1 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 02

1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 02

1.2.3 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 03

1.2.4 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 05

1.2.5 පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය 09

II කොටස

2.0 ප්‍රශ්න සහ පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු - I පත්‍රය 10

2.1 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I පත්‍රයේ ව්‍යුහය 10

2.2 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I පත්‍රය 11

2.3 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය 17

2.4 I පත්‍රයේ වරණ තෝරා ඇති ආකාරය 18

2.5 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක 19

2.6 I පත්‍රයේ විශ්ලේෂණය 20

III කොටස

3.0 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - II පත්‍රය 23

3.1 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II පත්‍රයේ ව්‍යුහය 23

3.2 II පත්‍රයේ විශ්ලේෂණය 24

3.3 II පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා සුවිශේෂී නිරීක්ෂණ හා නිර්දේශ 27

3.3.1 ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂිත පිළිතුර 27
3.3.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය 29
3.3.3 ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂිත පිළිතුර 31
3.3.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය 33
3.3.5 ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂිත පිළිතුර 35
3.3.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය 37
3.3.7 ප්‍රශ්න අංක 8 සහ අපේක්ෂිත පිළිතුර 40
3.3.8 ප්‍රශ්න අංක 8 සඳහා විශ්ලේෂණය 42
3.3.9 ප්‍රශ්න අංක 9 සඳහා අපේක්ෂිත පිළිතුර 44
3.3.10 ප්‍රශ්න අංක 9 සඳහා විශ්ලේෂණය 46
3.3.11 ප්‍රශ්න අංක 10 සඳහා අපේක්ෂිත පිළිතුර 48
3.3.12 ප්‍රශ්න අංක 10 සඳහා විශ්ලේෂණය 50
3.3.13 ප්‍රශ්න අංක 11 සඳහා අපේක්ෂිත පිළිතුර 52
3.3.14 ප්‍රශ්න අංක 11 සඳහා විශ්ලේෂණය 56

# වගු නාමාවලිය


| වගු අංකය | පිටු අංකය |
|---|---|
| වගුව 1.1 මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 02 |
| වගුව 1.2 ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 02 |
| වගුව 1.3 දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 03 |
| වගුව 1.4 අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 05 |
| වගුව 1.5 පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය | 09 |
| වගුව 2.1 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය | 17 |
| වගුව 2.2 එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය | 18 |

## ප්‍රස්තාර නාමාවලිය

ප්‍රස්තාරය 2.1 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක 19
ප්‍රස්තාරය 3.1 II පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ඇති ආකාරය සහ එක් එක් ප්‍රශ්නයේ පහසුතාව 24
ප්‍රස්තාරය 3.2 පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය 25
ප්‍රස්තාරය 3.3 II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක 26
ප්‍රස්තාරය 3.4 ප්‍රශ්නය අංක 1 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 29
ප්‍රස්තාරය 3.5 1 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය 29
ප්‍රස්තාරය 3.6 ප්‍රශ්නය අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 33
ප්‍රස්තාරය 3.7 2 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය 33
ප්‍රස්තාරය 3.8 ප්‍රශ්නය අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 37
ප්‍රස්තාරය 3.9 3 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය 37
ප්‍රස්තාරය 3.10 ප්‍රශ්නය අංක 8 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 42
ප්‍රස්තාරය 3.11 8 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය 42
ප්‍රස්තාරය 3.12 ප්‍රශ්නය අංක 9 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 46
ප්‍රස්තාරය 3.13 9 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය 46
ප්‍රස්තාරය 3.14 ප්‍රශ්නය අංක 10 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 50
ප්‍රස්තාරය 3.15 10 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය 50
ප්‍රස්තාරය 3.16 ප්‍රශ්නය අංක 11 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 56
ප්‍රස්තාරය 3.17 11 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය 56

# I කොටස

## 1.0 විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු

## 1.1 විෂය අරමුණු

- සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයෙහි ආරම්භය, වර්ධනය, ශාස්ත්‍රීය පසුබිම හා ප්‍රවණතා පිළිබඳ අවබෝධය ලැබීම.
- විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමට අවශ්‍ය මාධ්‍ය සාක්ෂරතා ඥානය ශිෂ්‍යයන් තුළ වර්ධනය් කිරීම.
- න්‍යායාත්මක හා ප්‍රායෝගික විෂයය කරුණු සිය ජීවිත චර්යාවෙන් ම පෙන්නුම් කරමින් සාර්ථක සන්නිවේදකයකු බවට පත්වීම.
- සාර්ථක සන්නිවේදනයක් මඟින් යහපත් වූ අන්තර් සම්බන්ධතා පවත්වා ගත හැකි සහජීවනය අගය කරන සාමාජීය සත්ත්වයෙකු බවට පත් වීම.
- නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට සැමට ඇති අයිතිය හා එහි සීමාවන්ට ගරු කරන ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු වීම.
- ජාතික ජාත්‍යන්තර තලයන්හි මාධ්‍ය ප්‍රවණතා හා සුවිශේෂතා පිළිබඳ අවබෝධයෙන් යුතුව අනාගතයට මුහුණ දීමේ ශක්තිය හා නිපුණතා වර්ධනය කර ගැනිම.
- නිර්මාණශීලී ව මාධ්‍ය සන්දේශ සම්පාදනය කිරීමේ හා සන්නිවේදනයේ යෙදීමේ හැකියාව ලබා ගැනීම.
- ජාතික සංවර්ධනය උදෙසා සන්නිවේදනයේ කාර්යභාරය හඳුනාගත් එයට සක්‍රීයව දායකත්වය ලබා දෙන පුරවැසියකු වීම.

**මූලාශ්‍රය:** සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය නිර්දේශය 12 හා 13 ශ්‍රේණි, 2017, ජා.අ.ආ

## 1.2 අපේක්ෂකයන්ගේ විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

**වගුව 1.1**

මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| මාධ්‍යය | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | මුළු අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | |
| සිංහල | 7,818 | 34.51 | 14,835 | 65.49 | 22,653 | 1,498 | 30.88 | 3,353 | 69.12 | 4,851 | 9,316 | 33.87 | 18,188 | 66.13 | 27,504 |
| දෙමළ | 398 | 42.57 | 537 | 57.43 | 935 | 395 | 63.81 | 224 | 36.19 | 619 | 793 | 51.03 | 761 | 48.97 | 1,554 |
| ඉංග්‍රීසි | 44 | 26.99 | 119 | 73.01 | 163 | 40 | 43.48 | 52 | 56.52 | 92 | 84 | 32.94 | 171 | 67.06 | 255 |
| එකතුව | **8,260** | **34.78** | **15,491** | **65.22** | **23,751** | **1,933** | **34.75** | **3,629** | **65.25** | **5,562** | **10,193** | **34.77** | **19,120** | **65.23** | **29,313** |

**මූලාශ්‍රය:** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

2021 වර්ෂයේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය සඳහා පෙනී සිටි මුළු අපේක්ෂකයන් සංඛ්‍යාව 29,313කි. ඉන් 81.03% (23,751)ක් පාසල් අපේක්ෂකයන් වේ. 18.97% (5,562)ක් පෞද්ගලික අපේක්ෂකයන් වේ. මුළු අපේක්ෂකයන්ගෙන් 93.83% (27,504)ක් සිංහල මාධ්‍යයෙන් ද 5.30% (1,554) ක්, දෙමළ මාධ්‍යයෙන් ද 0.86% (255)ක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද පෙනී සිට ඇත. මුළු අපේක්ෂකයන් අතුරින් පුරුෂ අපේක්ෂකයන් (34.77%)ක් වන අතර ස්ත්‍රී අපේක්ෂකයන් (65.23%)කි. පාසල් අපේක්ෂකයන් අතුරෙන් 34.78%ක් පුරුෂ අපේක්ෂකයන් වන අතර 65.22%ක් ස්ත්‍රී අපේක්ෂකයන් වේ.

විභාගයට පෙනී සිටි පාසල් අපේක්ෂකයන් සහ පෞද්ගලික අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව සැලකීමේදී පුරුෂ අපේක්ෂකයන්ට වඩා ස්ත්‍රී අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව ඉහළ අගයක් ගෙන ඇත

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

**වගුව 1.2**

ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| ශ්‍රේණිය | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | මුළු අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | | ස්ත්‍රී | | | පුරුෂ | | ස්ත්‍රී | | | පුරුෂ | | ස්ත්‍රී | | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | එකතුව | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | එකතුව | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | එකතුව |
| A | 139 | 1.68 | 1,068 | 6.89 | 1,207 | 43 | 2.22 | 142 | 3.91 | 185 | 182 | 1.79 | 1,210 | 6.33 | 1,392 |
| B | 343 | 4.15 | 2,162 | 13.96 | 2,505 | 119 | 6.16 | 387 | 10.66 | 506 | 462 | 4.53 | 2,549 | 13.33 | 3,011 |
| C | 1,387 | 16.79 | 5,102 | 32.94 | 6,489 | 430 | 22.25 | 1,020 | 28.11 | 1,450 | 1,817 | 17.83 | 6,122 | 32.02 | 7,939 |
| S | 3,146 | 38.09 | 4,911 | 31.70 | 8,057 | 653 | 33.78 | 1,221 | 33.65 | 1,874 | 3,799 | 37.27 | 6,132 | 32.07 | 9,931 |
| F | 3,245 | 39.29 | 2,248 | 14.51 | 5,493 | 688 | 35.59 | 859 | 23.67 | 1,547 | 3,933 | 38.59 | 3,107 | 16.25 | 7,040 |
| එකතුව | **8,260** | 100.00 | **15,491** | 100.00 | **23,751** | **1,933** | 100.00 | **3,629** | 100.00 | **5,562** | **10,193** | 100.00 | **19,120** | 100.00 | **29,313** |

**මූලාශ්‍රය:** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

2021 වර්ෂයේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය සඳහා පෙනී සිටි මුළු අපේක්ෂකයන් සංඛ්‍යාව 29,313කි. ඉන් 75.98% (22,273)ක් සමත් වී ඇති අතර 24.01% (7,040)ක් අසමත් ය. සමස්ත අපේක්ෂකයන්ගෙන් 4.74% (1,392)ක් A සාමාර්ථ ද, 10.27% (3,011)ක් B සාමාර්ථ ද, 27.08 % (7,939) ක් C සාමාර්ථ ද, 33.87 % (9,931) ක් S සාමාර්ථ ද, ලබා ඇත.

ශ්‍රේණි ලබා ගැනීමේ දී සියලු අපේක්ෂකයන් සැලකූ විට වැඩිම A සාමාර්ථ ප්‍රතිශතයක් ලබා ඇත්තේ ස්ත්‍රී අපේක්ෂකයන් පාසල් අපේක්ෂකයන් හා පෞද්ගලික අපේක්ෂකයන් සැලකූ විට ද A සාමාර්ථ වැඩි ප්‍රතිශතයක් ලබා ඇත්තේ ස්ත්‍රී අපේක්ෂකයන් වේ. පාසල් අපේක්ෂකයන්ගෙන් 23.12% (5,493) ක් සහ පෞද්ගලික අපේක්ෂකයන් 27.81% (1,547)ක් ද මෙම විෂයය අසමත්ය.

### 1.2.3 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

**වගුව 1.3**

දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෙනී සිටි අපේක්ෂකයන් | A | | B | | C | | S | | A+B+C+S | | F | |
| | | සංඛ්‍යාව | % | සං:ඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 3,391 | 177 | 5.22 | 334 | 9.85 | 953 | 28.10 | 1,186 | 34.97 | 2,650 | 78.15 | 741 | 21.85 |
| ගම්පහ | 3,048 | 138 | 4.53 | 298 | 9.78 | 781 | 25.62 | 1,095 | 35.93 | 2,312 | 75.85 | 736 | 24.15 |
| කළුතර | 1,371 | 82 | 5.98 | 151 | 11.01 | 356 | 25.97 | 459 | 33.48 | 1,048 | 76.44 | 323 | 23.56 |
| නුවර | 1,517 | 65 | 4.28 | 153 | 10.09 | 417 | 27.49 | 522 | 34.41 | 1,157 | 76.27 | 360 | 23.73 |
| මාතලේ | 682 | 35 | 5.13 | 80 | 11.73 | 213 | 31.23 | 225 | 32.99 | 553 | 81.09 | 129 | 18.91 |
| නුවර එළිය | 324 | 12 | 3.70 | 32 | 9.88 | 89 | 27.47 | 127 | 39.20 | 260 | 80.25 | 64 | 19.75 |
| ගාල්ල | 1,063 | 85 | 8.00 | 129 | 12.14 | 274 | 25.78 | 317 | 29.82 | 805 | 75.73 | 258 | 24.27 |
| මාතර | 983 | 48 | 4.88 | 98 | 9.97 | 247 | 25.13 | 337 | 34.28 | 730 | 74.26 | 253 | 25.74 |
| හම්බන්තොට | 595 | 24 | 4.03 | 67 | 11.26 | 171 | 28.74 | 173 | 29.08 | 435 | 73.11 | 160 | 26.89 |
| යාපනය | 272 | 18 | 6.62 | 31 | 11.40 | 85 | 31.25 | 82 | 30.15 | 216 | 79.41 | 56 | 20.59 |
| මන්නාරම | 30 | - | 0.00 | 3 | 10.00 | 8 | 26.67 | 16 | 53.33 | 27 | 90.00 | 3 | 10.00 |
| වවුනියාව | 62 | 1 | 1.61 | 4 | 6.45 | 21 | 33.87 | 24 | 38.71 | 50 | 80.65 | 12 | 19.35 |
| මුලතිව් | 10 | - | 0.00 | 1 | 10.00 | 3 | 30.00 | 4 | 40.00 | 8 | 80.00 | 2 | 20.00 |
| කිලිනොච්චිය | 21 | - | 0.00 | - | 0.00 | 7 | 33.33 | 7 | 33.33 | 14 | 66.67 | 7 | 33.33 |
| මඩකලපුව | 268 | | 3.36 | 29 | 10.82 | 78 | 29.10 | 95 | 35.45 | 211 | 78.73 | 57 | 21.27 |
| අම්පාර | 534 | 20 | 3.75 | 49 | 9.18 | 143 | 26.78 | 181 | 33.90 | 393 | 73.60 | 141 | 26.40 |
| ත්‍රිකුණාමලය | 255 | 16 | 6.27 | 34 | 13.33 | 87 | 34.12 | 76 | 29.80 | 213 | 83.53 | 42 | 16.47 |
| කුරුණෑගල | 2,671 | 111 | 4.16 | 228 | 8.54 | 702 | 26.28 | 987 | 36.95 | 2,028 | 75.93 | 643 | 24.07 |
| පුත්තලම | 523 | 39 | 7.46 | 58 | 11.09 | 171 | 32.70 | 163 | 31.17 | 431 | 82.41 | 92 | 17.59 |
| අනුරාධපුරය | 1,276 | 56 | 4.39 | 136 | 10.66 | 301 | 23.59 | 417 | 32.68 | 910 | 71.32 | 366 | 28.68 |
| පොළොන්නරුව | 85 | 5 | 5.88 | 11 | 12.94 | 10 | 11.76 | 22 | 25.88 | 48 | 56.47 | 37 | 43.53 |
| බදුල්ල | 1,298 | 87 | 6.70 | 191 | 14.71 | 440 | 33.90 | 422 | 32.51 | 1,140 | 87.83 | 158 | 12.17 |
| මොණරාගල | 568 | 32 | 5.63 | 69 | 12.15 | 171 | 30.11 | 192 | 33.80 | 464 | 81.69 | 104 | 18.31 |
| රත්නපුර | 2,103 | 110 | 5.23 | 236 | 11.22 | 553 | 26.30 | 661 | 31.43 | 1,560 | 74.18 | 543 | 25.82 |
| කෑගල්ල | 801 | 37 | 4.62 | 83 | 10.36 | 208 | 25.97 | 267 | 33.33 | 595 | 74.28 | 206 | 25.72 |
| සමස්ත දිවයින | **23,751** | **1,207** | **5.08** | **2,505** | **10.55** | **6,489** | **27.32** | **8,057** | **33.92** | **18,258** | **76.87** | **5,493** | **23.13** |

**මූලාශ්‍රය: පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ**

2021 වර්ෂයේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය සඳහා දිස්ත්‍රික්ක අනුව අපේක්ෂකයන් ලබාගත් A සමර්ථය සැලකීමේදී ගාල්ල දිස්ත්‍රික්කය A සමර්ථ ලබා ගැනීම 8% (1,063)කි. වැඩිම අපේක්ෂකයන් සංඛ්‍යාවක් කොළඹ දිස්ත්‍රික්කයෙන් (3391) පෙනී සිටිය ද A සමර්ථ ලබා ඇත්තේ 5.22% (177)කි.

විභාගයට පෙනී සිටි අපේක්ෂකයින්ගෙන් සමත් වීමේ ප්‍රතිශතය දිස්ත්‍රික් මට්ටමින් ඉහළ අගයක් ගන්නේ මන්නාරම දිස්ත්‍රික්කය යි. එම ප්‍රතිශතය 90% කි. දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 12 කි. දිවයිනේ සමස්ත සමත් ප්‍රතිශතය හා 76.87% ඉක්ම වූ සමස්ත ප්‍රතිශතයක් වාර්තා කර ඇත.

## 1.2.4 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

### වගුව 1.4

**අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය**

| කලාපය | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෙනී සිටි අපේක්ෂකයන් | A | | B | | C | | S | | A+B+C+S | | W | |
| | | සංඛ්‍යාව | % | සං:ඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1 කොළඹ | 1,247 | 76 | 6.09 | 106 | 8.50 | 335 | 26.86 | 440 | 35.28 | 957 | 76.74 | 290 | 23.26 |
| 2 හෝමාගම | 501 | 32 | 6.39 | 53 | 10.58 | 142 | 28.34 | 151 | 30.14 | 378 | 75.45 | 123 | 24.55 |
| 3 ශ්‍රී ජයවර්ධනපුර | 1,015 | 46 | 4.53 | 114 | 11.23 | 301 | 29.66 | 337 | 33.20 | 798 | 78.62 | 217 | 21.38 |
| 4 පිළියන්දල | 628 | 23 | 3.66 | 61 | 9.71 | 175 | 27.87 | 258 | 41.08 | 517 | 82.32 | 111 | 17.68 |
| 5 ගම්පහ | 1,031 | 62 | 6.01 | 151 | 14.65 | 267 | 25.90 | 331 | 32.10 | 811 | 78.66 | 220 | 21.34 |
| 6 මීනුවන්ගොඩ | 527 | 16 | 3.04 | 40 | 7.59 | 144 | 27.32 | 195 | 37.00 | 395 | 74.95 | 132 | 25.05 |
| 7 මීගමුව | 676 | 24 | 3.55 | 45 | 6.66 | 174 | 25.74 | 261 | 38.61 | 504 | 74.56 | 172 | 25.44 |
| 8 කැලණිය | 814 | 36 | 4.42 | 62 | 7.62 | 196 | 24.08 | 308 | 37.84 | 602 | 73.96 | 212 | 26.04 |
| 9 කළුතර | 691 | 34 | 4.92 | 73 | 10.56 | 190 | 27.50 | 249 | 36.03 | 546 | 79.02 | 145 | 20.98 |
| 10 මතුගම | 455 | 25 | 5.49 | 42 | 9.23 | 107 | 23.52 | 146 | 32.09 | 320 | 70.33 | 135 | 29.67 |
| 11 හොරණ | 225 | 23 | 10.22 | 36 | 16.00 | 59 | 26.22 | 64 | 28.44 | 182 | 80.89 | 43 | 19.11 |
| 12 මහනුවර | 811 | 50 | 6.17 | 94 | 11.59 | 257 | 31.69 | 294 | 36.25 | 695 | 85.70 | 116 | 14.30 |
| 13 දෙනුවර | 141 | 5 | 3.55 | 10 | 7.09 | 31 | 21.99 | 49 | 34.75 | 95 | 67.38 | 46 | 32.62 |
| 14 ගම්පොළ | 173 | 0 | 0.00 | 12 | 6.94 | 30 | 17.34 | 62 | 35.84 | 104 | 60.12 | 69 | 39.88 |
| 15 තෙල්දෙණිය | 34 | 4 | 11.76 | 7 | 20.59 | 13 | 38.24 | 6 | 17.65 | 30 | 88.24 | 4 | 11.76 |
| 16 වත්තේගම | 142 | 2 | 1.41 | 10 | 7.04 | 41 | 28.87 | 46 | 32.39 | 99 | 69.72 | 43 | 30.28 |
| 17 කටුගස්තොට | 216 | 4 | 1.85 | 20 | 9.26 | 45 | 20.83 | 65 | 30.09 | 134 | 62.04 | 82 | 37.96 |
| 18 මාතලේ | 304 | 13 | 4.28 | 30 | 9.87 | 103 | 33.88 | 97 | 31.91 | 243 | 79.93 | 61 | 20.07 |
| 19 ගලේවෙල | 256 | 15 | 5.86 | 31 | 12.11 | 73 | 28.52 | 85 | 33.20 | 204 | 79.69 | 52 | 20.31 |
| 20 නාවුල | 72 | 2 | 2.78 | 4 | 5.56 | 23 | 31.94 | 32 | 44.44 | 61 | 84.72 | 11 | 15.28 |
| 21 විල්ගමුව | 50 | 5 | 10.00 | 15 | 30.00 | 14 | 28.00 | 11 | 22.00 | 45 | 90.00 | 5 | 10.00 |
| 22 නුවරඑළිය | 60 | 2 | 3.33 | 6 | 10.00 | 18 | 30.00 | 27 | 45.00 | 53 | 88.33 | 7 | 11.67 |
| 23 කොත්මලේ | 29 | 2 | 6.90 | 2 | 6.90 | 6 | 20.69 | 12 | 41.38 | 22 | 75.86 | 7 | 24.14 |
| 24 හැටන් | 116 | 5 | 4.31 | 16 | 13.79 | 34 | 29.31 | 43 | 37.07 | 98 | 84.48 | 18 | 15.52 |
| 25 වලපනේ | 1 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | - | 0.00 | 1 | 100.00 | - | 0.00 |

| කලාපය | පෙනී සිටි අපේක්ෂකයන් | A | | B | | C | | S | | A+B+C+S | | W | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සං:ඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **26 හඟුරන්කෙත** | 118 | 3 | 2.54 | 8 | 6.78 | 30 | 25.42 | 45 | 38.14 | 86 | 72.88 | 32 | 27.12 |
| **27 ගාල්ල** | 663 | 51 | 7.69 | 81 | 12.22 | 178 | 26.85 | 203 | 30.62 | 513 | 77.38 | 150 | 22.62 |
| **28 ඇල්පිටිය** | 145 | 15 | 10.34 | 20 | 13.79 | 33 | 22.76 | 37 | 25.52 | 105 | 72.41 | 40 | 27.59 |
| **29 අම්බලන්ගොඩ** | 244 | 19 | 7.79 | 28 | 11.48 | 58 | 23.77 | 73 | 29.92 | 178 | 72.95 | 66 | 27.05 |
| **30 උඩුගම** | 11 | 0 | 0.00 | 0 | 0.00 | 5 | 45.45 | 4 | 36.36 | 9 | 81.82 | 2 | 18.18 |
| **31 මාතර** | 711 | 31 | 4.36 | 77 | 10.83 | 181 | 25.46 | 245 | 34.46 | 534 | 75.11 | 177 | 24.89 |
| **32 අකුරැස්ස** | 115 | 12 | 10.43 | 11 | 9.57 | 35 | 30.43 | 28 | 24.35 | 86 | 74.78 | 29 | 25.22 |
| **33 මුලටියන(හක්මණ)** | 130 | 3 | 2.31 | 6 | 4.62 | 28 | 21.54 | 58 | 44.62 | 95 | 73.08 | 35 | 26.92 |
| **34 දෙනියාය(මොරවක)** | 27 | 2 | 7.41 | 4 | 14.81 | 3 | 11.11 | 6 | 22.22 | 15 | 55.56 | 12 | 44.44 |
| **35 තංගල්ල** | 236 | 17 | 7.20 | 32 | 13.56 | 69 | 29.24 | 68 | 28.81 | 186 | 78.81 | 50 | 21.19 |
| **36 හම්බන්තොට** | 161 | 1 | 0.62 | 10 | 6.21 | 36 | 22.36 | 47 | 29.19 | 94 | 58.39 | 67 | 41.61 |
| **37 වලස්මුල්ල** | 198 | 6 | 3.03 | 25 | 12.63 | 66 | 33.33 | 58 | 29.29 | 155 | 78.28 | 43 | 21.72 |
| **38 යාපනය** | 87 | 5 | 5.75 | 9 | 10.34 | 24 | 27.59 | 29 | 33.33 | 67 | 77.01 | 20 | 22.99 |
| **39 අයිලන්ඩ්** | 14 | 2 | 14.29 | 1 | 7.14 | 4 | 28.57 | 5 | 35.71 | 12 | 85.71 | 2 | 14.29 |
| **40 තෙන්නමරච්චි** | 00 | 0 | - | 0 | - | - | - | - | - | 00 | - | - | - |
| **41 වලිකාමම්** | 164 | 10 | 6.10 | 20 | 12.20 | 53 | 32.32 | 47 | 28.66 | 130 | 79.27 | 34 | 20.73 |
| **42 වඩමාරච්චි** | 7 | 1 | 14.29 | 1 | 14.29 | 4 | 57.14 | 1 | 14.29 | 7 | 100.00 | - | 0.00 |
| **43 කිලිනොච්චි දකුණ** | 11 | 0 | 0.00 | 0 | 0.00 | 4 | 36.36 | 3 | 27.27 | 7 | 63.64 | 4 | 36.36 |
| **44 කිලිනොච්චි උතුර** | 10 | 0 | 0.00 | 0 | 0.00 | 3 | 30.00 | 4 | 40.00 | 7 | 70.00 | 3 | 30.00 |
| **45 මන්නාරම** | 30 | 0 | 0.00 | 3 | 10.00 | 8 | 26.67 | 16 | 53.33 | 27 | 90.00 | 3 | 10.00 |
| **46 මඩු** | 00 | 0 | - | 0 | - | - | - | - | - | 00 | - | - | - |
| **47 වව්නියා දකුණ** | 39 | 0 | 0.00 | 2 | 5.13 | 13 | 33.33 | 14 | 35.90 | 29 | 74.36 | 10 | 25.64 |
| **48 වව්නියා උතුර** | 23 | 1 | 4.35 | 2 | 8.70 | 8 | 34.78 | 10 | 43.48 | 21 | 91.30 | 2 | 8.70 |
| **49 මුලතිව්** | 00 | 0 | - | 0 | - | - | - | - | - | 00 | - | - | - |
| **50 තුනුක්කායි** | 10 | 0 | 0.00 | 1 | 10.00 | 3 | 30.00 | 4 | 40.00 | 8 | 80.00 | 2 | 20.00 |

| කලාපය | | පෙනී සිටි අපේක්ෂකයන් | A | | B | | C | | S | | A+B+C+S | | W | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 51 | මඩකලපුව | 87 | 2 | 2.30 | 9 | 10.34 | 24 | 27.59 | 34 | 39.08 | 69 | 79.31 | 18 | 20.69 |
| 52 | කල්කුඩා | 35 | 0 | 0.00 | 1 | 2.86 | 5 | 14.29 | 16 | 45.71 | 22 | 62.86 | 13 | 37.14 |
| 53 | පදිරිප්පු | 81 | 2 | 2.47 | 6 | 7.41 | 22 | 27.16 | 31 | 38.27 | 61 | 75.31 | 20 | 24.69 |
| 54 | මඩකලපුව මධ්‍යම | 36 | 5 | 13.89 | 9 | 25.00 | 11 | 30.56 | 8 | 22.22 | 33 | 91.67 | 3 | 8.33 |
| 55 | මඩකලපුව බටහිර | 29 | 0 | 0.00 | 4 | 13.79 | 16 | 55.17 | 6 | 20.69 | 26 | 89.66 | 3 | 10.34 |
| 56 | අම්පාර | 259 | 6 | 2.32 | 17 | 6.56 | 65 | 25.10 | 89 | 34.36 | 177 | 68.34 | 82 | 31.66 |
| 57 | කල්මුණේ | 1 | 0 | 0.00 | 0 | 0.00 | - | 0.00 | 1 | 100.00 | 1 | 100.00 | - | 0.00 |
| 58 | සමන්තුරෙ | 23 | 5 | 21.74 | 2 | 8.70 | 3 | 13.04 | 8 | 34.78 | 18 | 78.26 | 5 | 21.74 |
| 59 | මහඔය | 126 | 3 | 2.38 | 14 | 11.11 | 36 | 28.57 | 49 | 38.89 | 102 | 80.95 | 24 | 19.05 |
| 60 | දෙහිඅත්තකන්ඩිය | 65 | 5 | 7.69 | 11 | 16.92 | 29 | 44.62 | 18 | 27.69 | 63 | 96.92 | 2 | 3.08 |
| 61 | අක්කරෙපත්තු | 47 | 1 | 2.13 | 3 | 6.38 | 5 | 10.64 | 11 | 23.40 | 20 | 42.55 | 27 | 57.45 |
| 62 | තිරුක්කෝවිල් | 13 | 0 | 0.00 | 2 | 15.38 | 5 | 38.46 | 5 | 38.46 | 12 | 92.31 | 1 | 7.69 |
| 63 | ත්‍රිකුණාමලය | 80 | 7 | 8.75 | 7 | 8.75 | 26 | 32.50 | 25 | 31.25 | 65 | 81.25 | 15 | 18.75 |
| 64 | මුතූර් | 1 | 0 | 0.00 | 0 | 0.00 | - | 0.00 | 1 | 100.00 | 1 | 100.00 | - | 0.00 |
| 65 | කන්තලේ | 100 | 5 | 5.00 | 12 | 12.00 | 29 | 29.00 | 33 | 33.00 | 79 | 79.00 | 21 | 21.00 |
| 66 | කින්නියා | 27 | 2 | 7.41 | 3 | 11.11 | 14 | 51.85 | 6 | 22.22 | 25 | 92.59 | 2 | 7.41 |
| 67 | ත්‍රිකුණාමලය උතුර | 47 | 2 | 4.26 | 12 | 25.53 | 18 | 38.30 | 11 | 23.40 | 43 | 91.49 | 4 | 8.51 |
| 68 | කුරුණෑගල | 701 | 37 | 5.28 | 64 | 9.13 | 216 | 30.81 | 251 | 35.81 | 568 | 81.03 | 133 | 18.97 |
| 69 | කුලියාපිටිය | 535 | 29 | 5.42 | 55 | 10.28 | 141 | 26.36 | 187 | 34.95 | 412 | 77.01 | 123 | 22.99 |
| 70 | නිකවැරටිය | 426 | 10 | 2.35 | 28 | 6.57 | 95 | 22.30 | 160 | 37.56 | 293 | 68.78 | 133 | 31.22 |
| 71 | මහව | 367 | 10 | 2.72 | 31 | 8.45 | 103 | 28.07 | 129 | 35.15 | 273 | 74.39 | 94 | 25.61 |
| 72 | ගිරිඋල්ල | 359 | 14 | 3.90 | 30 | 8.36 | 87 | 24.23 | 144 | 40.11 | 275 | 76.60 | 84 | 23.40 |
| 73 | ඉබ්බාගමුව | 283 | 11 | 3.89 | 20 | 7.07 | 60 | 21.20 | 116 | 40.99 | 207 | 73.14 | 76 | 26.86 |
| 74 | පුත්තලම | 239 | 15 | 6.28 | 28 | 11.72 | 81 | 33.89 | 73 | 30.54 | 197 | 82.43 | 42 | 17.57 |
| 75 | හලාවත | 284 | 24 | 8.45 | 30 | 10.56 | 90 | 31.69 | 90 | 31.69 | 234 | 82.39 | 50 | 17.61 |
| 76 | අනුරාධපුර | 495 | 32 | 6.46 | 68 | 13.74 | 121 | 24.44 | 155 | 31.31 | 376 | 75.96 | 119 | 24.04 |
| 77 | තඹුත්තේගම | 212 | 5 | 2.36 | 15 | 7.08 | 41 | 19.34 | 76 | 35.85 | 137 | 64.62 | 75 | 35.38 |
| 78 | කැකිරාව | 260 | 11 | 4.23 | 23 | 8.85 | 64 | 24.62 | 84 | 32.31 | 182 | 70.00 | 78 | 30.00 |
| 79 | ගලෙන්බිඳුණුවැව | 131 | 3 | 2.29 | 12 | 9.16 | 34 | 25.95 | 51 | 38.93 | 100 | 76.34 | 31 | 23.66 |
| 80 | කැබිතිගොල්ලෑව | 178 | 5 | 2.81 | 18 | 10.11 | 41 | 23.03 | 51 | 28.65 | 115 | 64.61 | 63 | 35.39 |

| කලාපය | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෙනී සිටි අපේක්ෂකයන් | A | | B | | C | | S | | A+B+C+S | | W | |
| | | සංඛ්‍යාව | % | සං:ඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **81** පොලොන්නරුව | 25 | 4 | 16.00 | 3 | 12.00 | 2 | 8.00 | 8 | 32.00 | 17 | 68.00 | 8 | 32.00 |
| **82** හිඟුරක්ගොඩ | 16 | 1 | 6.25 | 4 | 25.00 | 4 | 25.00 | 4 | 25.00 | 13 | 81.25 | 3 | 18.75 |
| **83** දිඹුලාගල | 44 | 0 | 0.00 | 4 | 9.09 | 4 | 9.09 | 10 | 22.73 | 18 | 40.91 | 26 | 59.09 |
| **84** බදුල්ල | 355 | 32 | 9.01 | 67 | 18.87 | 125 | 35.21 | 101 | 28.45 | 325 | 91.55 | 30 | 8.45 |
| **85** බණ්ඩාරවෙල | 288 | 24 | 8.33 | 50 | 17.36 | 84 | 29.17 | 91 | 31.60 | 249 | 86.46 | 39 | 13.54 |
| **86** මහියංගනය | 249 | 15 | 6.02 | 30 | 12.05 | 88 | 35.34 | 80 | 32.13 | 213 | 85.54 | 36 | 14.46 |
| **87** වැලිමඩ | 226 | 9 | 3.98 | 31 | 13.72 | 88 | 38.94 | 78 | 34.51 | 206 | 91.15 | 20 | 8.85 |
| **88** පස්සර | 56 | 1 | 1.79 | 7 | 12.50 | 22 | 39.29 | 14 | 25.00 | 44 | 78.57 | 12 | 21.43 |
| **89** වියලුව | 124 | 6 | 4.84 | 6 | 4.84 | 33 | 26.61 | 58 | 46.77 | 103 | 83.06 | 21 | 16.94 |
| **90** මොනරාගල | 198 | 11 | 5.56 | 18 | 9.09 | 61 | 30.81 | 78 | 39.39 | 168 | 84.85 | 30 | 15.15 |
| **91** වැල්ලවාය | 91 | 2 | 2.20 | 7 | 7.69 | 33 | 36.26 | 29 | 31.87 | 71 | 78.02 | 20 | 21.98 |
| **92** බිබිල | 251 | 16 | 6.37 | 37 | 14.74 | 70 | 27.89 | 79 | 31.47 | 202 | 80.48 | 49 | 19.52 |
| **93** තණමල්විල | 28 | 3 | 10.71 | 7 | 25.00 | 7 | 25.00 | 6 | 21.43 | 23 | 82.14 | 5 | 17.86 |
| **94** රත්නපුර | 1,002 | 61 | 6.09 | 123 | 12.28 | 275 | 27.45 | 312 | 31.14 | 771 | 76.95 | 231 | 23.05 |
| **95** බලන්ගොඩ | 459 | 17 | 3.70 | 54 | 11.76 | 118 | 25.71 | 130 | 28.32 | 319 | 69.50 | 140 | 30.50 |
| **96** නිවිතිගල | 227 | 11 | 4.85 | 16 | 7.05 | 52 | 22.91 | 77 | 33.92 | 156 | 68.72 | 71 | 31.28 |
| **97** ඇඹිලිපිටිය | 415 | 21 | 5.06 | 43 | 10.36 | 108 | 26.02 | 142 | 34.22 | 314 | 75.66 | 101 | 24.34 |
| **98** කෑගල්ල | 411 | 17 | 4.14 | 45 | 10.95 | 110 | 26.76 | 131 | 31.87 | 303 | 73.72 | 108 | 26.28 |
| **99** මාවනැල්ල | 163 | 10 | 6.13 | 12 | 7.36 | 43 | 26.38 | 64 | 39.26 | 129 | 79.14 | 34 | 20.86 |
| **100** දෙහිඕවිට | 227 | 10 | 4.41 | 26 | 11.45 | 55 | 24.23 | 72 | 31.72 | 163 | 71.81 | 64 | 28.19 |
| සමස්ත දිවයින | **23,751** | **1,207** | **5.08** | **2,505** | **10.55** | **6,489** | **27.32** | **8,057** | **33.92** | **18,258** | **76.87** | **5,493** | **23.13** |

**මූලාශ්‍රය:** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

2021 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය සඳහා පළමුවරට පෙනී සිටි මුළු පාසල් අපේක්ෂකයන් සංඛ්‍යාව 23,751කි. පාසල් අපේක්ෂකයන්ගෙන් 76.87%(18,258)ක් සමත් වී ඇත. වලපනේ, වඩමාරච්චි, කල්මුණේ සහ මූතූර් කලාපවල සමත් වීම 100%කි. . වඩමාරච්චි කලාපයෙන් අපේක්ෂකයන් හත්දෙනෙකු ද, අනෙක් කලාපවලින් අපේක්ෂකයින් එක් අයෙකු බැගින් ද වශයෙන් පෙනී සිට ඇත.

### 1.2.5 පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය

වගුව 1.5

**පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය**

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| **91-100** | 23 | 0.08 | 29,313 | 100.00 |
| **81-90** | 471 | 1.61 | 29,290 | 99.92 |
| **71-80** | 1,474 | 5.03 | 28,819 | 98.31 |
| **61-70** | 2,798 | 9.55 | 27,345 | 93.29 |
| **51-60** | 4,317 | 14.73 | 24,547 | 83.74 |
| **41-50** | 5,797 | 19.78 | 20,230 | 69.01 |
| **31-40** | 6,759 | 23.06 | 14,433 | 49.24 |
| **21-30** | 5,400 | 18.42 | 7,674 | 26.18 |
| **11-20** | 2,165 | 7.39 | 2,274 | 7.76 |
| **00-10** | 109 | 0.38 | 109 | 0.38 |

මූලාශ්‍රය: පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණු පන්ති ප්‍රාන්තර අනුව ව්‍යාප්ත වී ඇති ආකාරය සැලකීමේදී බහුතරයක් අපේක්ෂකයන් 31-40 (6,759) පන්ති ප්‍රාන්තරයේ ලකුණු ලබාගෙන ඇති බව දැකිය හැකිය. වැඩිම අපේක්ෂකයන් සංඛ්‍යාවක් සහිත දෙවන පන්ති ප්‍රාන්තරය වන්නේ 41-50 වන අතර අපේක්ෂකයන් සංඛ්‍යාව 5,797ක් වේ. 91-100 පන්ති ප්‍රාන්තරයේ ලකුණු ලබාගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 23 ක් වන අතර එය 0.08%ක් තරම් අඩු ප්‍රතිශතයකි. එකදු ලකුණක්වත් ලබා නොගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 04 කි.

සැලකිය යුතු තරම් වැඩි අපේක්ෂක ප්‍රතිශතයක් වන 69.01% (2,0230)ක් ලකුණු 50 හෝ 50 අඩුවෙන් ලබා ඇත.

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - I පත්‍රය

**2.1 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I පත්‍රයේ ව්‍යුහය**

- කාලය පැය 02 යි
- මෙම පත්‍රය A, B හා C යනුවෙන් කොටස් තුනකින් යුක්තය
- වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 50 කි.

**මූලාශ්‍රය** : අ.පො.ස.(උ.පෙ.) විභාගය - 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාගය සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න, 2018 ශ්‍රී.ලං.වි.දෙ

## 2.3 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I පත්‍රය

### A කොටස

**1.** සන්නිවේදන ක්‍රියාවලියේදී 'බලපෑමෙහි' ඇති වැදගත්කම පෙන්වා දෙන ලද්දේ කවුද?
(1) විල්බර් ශ්‍රාම් (2) ශ්‍රාම් හා ඔස්ගුඩ්
(3) එඩ්වඩ් සැපීර් (4) ෂැනන් හා වීවර්
(5) හැරල්ඩ් ලැස්වෙල්

**2.** පණිවිඩයක ඇති කේත අර්ථකථනය කර අවබෝධ කර ගැනීම
(1) විකේතකරණයයි. (2) ආකේතකරණයයි. (3) පරිවර්තනයයි.
(4) වාර්තාකරණයයි. (5) ප්‍රතිපෝෂණයයි.

**3.** ජනමාධ්‍ය සන්දේශ හා ජනමත ප්‍රධානීන් අතර සම්බන්ධය පැහැදිලි කරන්නේ
(1) අත්දැකීම් පසුතලයෙනි. (2) සමාජානුයෝජනයෙනි.
(3) දොරටුපාල සංකල්පයෙනි. (4) දෙපියවර සංකල්පයෙනි.
(5) උත්තේජන ප්‍රතිචාර න්‍යායෙනි.

**4.** ජනමාධ්‍ය ග්‍රාහක ක්ෂේත්‍රය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ග්‍රාහක භූමිකාව සක්‍රීය වේ. (2) සෘජු ප්‍රතිපෝෂණයක් ලබා දෙයි.
(3) සාක්ෂරතාව සම මට්ටමේ පවතී. (4) විෂම ජාතීය කණ්ඩායමක් වේ.
(5) පුළුල් වින්දන ක්ෂේත්‍රයක් නොමැත.

**5.** ව්‍යාජ අවශ්‍යතා පාරිභෝගික මනසෙහි ප්‍රතිස්ථාපනය කිරීමෙහි ලා වඩාත් දායකවන ප්‍රධාන ධාරාවේ මාධ්‍යය වන්නේ
(1) ගුවන්විදුලියයි. (2) සිනමාවයි. (3) රූපවාහිනියයි.
(4) අන්තර්ජාලයයි. (5) සමාජ මාධ්‍යයි.

**6.** 'නවෝත්පාදන විසරණය' නමැති සංවර්ධන සංකල්පය හඳුන්වා දුන් සමාජ විද්‍යාඥයාගේ නම කුමක් ද?
(1) විල්බර් ශ්‍රාම් (2) ඩඩ්ලි සියර්ස් (3) මහත්මා ගාන්ධි
(4) විමල් දිසානායක (5) එවරට් එම්. රොජර්ස්

**7.** සංවර්ධනයට අදාළව වර්ග කිරීමේදී දෙවන ලෝකයට ඇතුළත් කර ඇති රට කුමක් ද?
(1) කැනඩාව (2) ඕස්ට්‍රේලියාව (3) නවසීලන්තය
(4) සෝවියට් රුසියාව (5) එක්සත් රාජධානිය

**8.** රූප භාෂා සංඥාර්ථ ප්‍රබලව හා නිර්මාණශීලීව යොදා ගත හැකි මාධ්‍යය කුමක් ද?
(1) රූපවාහිනිය (2) පෝස්ටරය (3) සිනමාව
(4) ඡායාරූපය (5) චිත්‍රය

**9.** නිර්වාචික සන්නිවේදනය පිළිබඳ නිවැරදි අදහස කුමක් ද?
(1) ශරීර භාෂාවෙන් පමණක් සිදුවෙයි.
(2) සංඥා භාෂාව පමණක් යොදා ගනියි.
(3) ලේඛනය තුළ භාවිත නොවේ.
(4) ශරීර බසින් කියවෙන අර්ථ රටින් රටට වෙනස් විය හැකි ය.
(5) බෙර හඬ, සයිරන් නලා හඬ යනාදිය මෙයට අයත් නොවේ.

**10.** සංකේත යනු
(1) නර්තනයට අදාළ වූවකි.
(2) වාචික සන්නිවේදනය ඉක්මවූවකි.
(3) වෙනත් යමක් නියෝජනය කරන්නකි.
(4) ආගමික අදහස් ඉදිරිපත් කරන්නකි.
(5) ශබ්ද නොව රූප නියෝජනය කරන්නකි..

**11.** පුද්ගලාන්තර සන්නිවේදනය පිළිබඳ **සදොස්** ප්‍රකාශය තෝරන්න.
(1) මුහුණට මුහුණලා සිදු කළ හැකි ය.
(2) සැම විටම තාක්ෂණය භාවිත කළ නොහැකි ය.
(3) නිර්වාචික සන්නිවේදනය මගින් වඩාත් ශක්තිමත් කළ හැකි ය.
(4) සමූහ සන්නිවේදනය තුළ සිදුවිය නොහැකි ය.
(5) භාවයන් වඩාත් තීව්‍ර ලෙස ප්‍රකාශයට පත් කළ හැකි ය.

12. කාර්යාල ප්‍රධානියා විසින් සේවකයින්ගේ දැනගැනීම සඳහා නිල නිවේදනයක් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරන ලදී. මෙහි දැක්වෙන සන්නිවේදන ස්වරූප මොනවා ද?
(1) විධිමත්, ලිඛිත හා දෘශ්‍ය (2) විධිමත්, අවාචික හා ලිඛිත
(3) අවාචික, දෘශ්‍ය හා අවිධිමත් (4) ලිඛිත, දෘශ්‍ය හා අවිධිමත්
(5) දෘශ්‍ය, අවාචික හා විධිමත්

13. 'ඔබට කීමට ඇති දේ ගොවියන්ට පැහැදිලිව කියන්න. එතකොට ඒ අය තේරුම් ගනීවි.' මෙම අදහසට ගැළපෙන සන්නිවේදන නිර්වචනයක් ඉදිරිපත් කළ විද්‍යාඥයා කවුද?
(1) චාල්ස් කූලි (2) විල්බර් ශ්‍රාම් (3) එඩ්වඩ් සැපීර්
(4) ක්ලෝඩ් ෂැනන් (5) හැරල්ඩ් ලැස්වෙල්

14. පාසල අලංකරණය සඳහා අරමුදල් රැස් කිරීමට සිසුන්ට අවශ්‍ය විය. ඒ සඳහා ස්ටිකරයක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් ඔවුහු සාකච්ඡා කළහ. මෙය අයත් වන සන්නිවේදන වර්ගය කුමක් ද?
(1) වාචික සන්නිවේදනය (2) සමූහ සන්නිවේදනය
(3) පුද්ගලාන්තර සන්නිවේදනය (4) කථන සන්නිවේදනය
(5) නිර්මාණාත්මක සන්නිවේදනය

15. ජන සන්නිවේදනයෙන් ඉටුකෙරෙන පහත සඳහන් කාර්යයන් අතර **අවම** වැදගත්කමක් ඇති කාර්යය කුමක් ද?
(1) විවිධ මතවාද ගොඩ නැංවීම
(2) සමාජානුයෝජනය සිදු කිරීම
(3) ග්‍රාහක අවශ්‍යතාවලට අනුකූල වීම
(4) සමාජ උරුමයන් පවරා දීම
(5) සමාජ සංවර්ධනය සඳහා පෙළඹවීම

16. **සදොස්** වාක්‍ය ඛණ්ඩය තෝරන්න.
මහජන සම්බන්ධතාව බොහෝ අවස්ථාවලදී
(1) ද්විපාර්ශ්වික ක්‍රියාවලියකි. (2) අලෙවිකරණ කාර්යයකි.
(3) කළමනාකරණ කාර්යයකි. (4) ප්‍රචාරණයෙන් වෙනස් වූවකි.
(5) දිග කාලීන ප්‍රතිඵල අපේක්ෂා කරන්නකි.

17. ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ බාහිර පාර්ශ්වයක මගපෙන්වීමකින් තොරව කටයුතු කිරීම
(1) වගවීමයි. (2) වගකීමයි. (3) ඇගයීමයි.
(4) ආචාරධර්මයි. (5) නියාමනයයි.

18. නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) සමූහ සන්නිවේදනය ද්විපාර්ශ්විකව පමණක් සිදුවේ.
(2) අන්තර්පුද්ගල සන්නිවේදනය ඒකමාර්ගිකව ද සිදු වේ.
(3) සංජානනය අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයෙන් බැහැර වූවකි.
(4) සමූහ සන්නිවේදනය ග්‍රාහක සංඛ්‍යාව මත පමණක් පදනම් වේ.
(5) අන්තර්පුද්ගල සන්නිවේදනය ද්විපාර්ශ්විකව පමණක් සිදුවෙයි.

- අංක **19** සිට **21** දක්වා වූ ප්‍රශ්න සඳහා පහත තොරතුරු භාවිත කරන්න.
සන්නිවේදනය පිළිබඳ ආකෘති 3ක් පහත දැක්වේ.
*A* - හැරල්ඩ් ලැස්වෙල් ආකෘතිය
*B* - ෂැනන් සහ වීවර් ආකෘතිය
*C* - ශ්‍රාම් සහ ඔස්ගුඩ් ආකෘතිය

19. ආකේතකරණය සහ විකේතකරණය පිළිබඳ අවධානය යොමු කරන නමුත් රේඛීය ස්වභාවයක් පෙන්නුම් **නොකරන්නේ**
(1) *A* පමණි. (2) *A* හා *B* පමණි.
(3) *B* පමණි. (4) *B* හා *C* පමණි.
(5) *C* පමණි.

20. ''මේ ටික දවසට වරුණි සැහෙන්න මහත් වෙලානෙ. කණ්ණාඩිය නැතුව මට අඳුරගන්නත් බැරි වුණා.'' සන්නිවේදන මූලිකාංගවලට අදාළව මෙම තත්ත්වය පැහැදිලි කිරීමට වඩාත් යෝග්‍ය වන්නේ
(1) *A* පමණි. (2) *A* හා *B* පමණි.
(3) *B* පමණි. (4) *B* හා *C* පමණි.
(5) A, B හා *C* සියල්ලම ය.

**21.** ''මුහුණපෑමට සිදුවිය හැකි සියලු යහපත් සහ අයහපත් තත්ත්වයන් පිළිබඳ සීතා ඉතා ගැඹුරින් සිතා බැලුවාං මෙම තීරණයට එළැඹියේ ඒ සියල්ල පිළිබඳව සිදුකළ මනා තක්සේරුවකින් අනතුරුවය....''.
ඉහත අවස්ථාව විවරණය කළ හැක්කේ
(1) *A* මගිනි. (2) *A* හා *B* මගිනි.
(3) *B* මගිනි. (4) *B* හා *C* මගිනි.
(5) *C* මගිනි.

**22.** ජනමාධ්‍ය මගින් ඉටුකරනු ලබන කාර්යයන් පිළිබඳ මූලික අවබෝධය ලැබීම අදාළ වන්නේ
(1) සුපරීක්ෂණයටයි. (2) සමාජානුයෝජනයටයි.
(3) විචාරශීලී චින්තනයටයි. (4) මාධ්‍ය සංස්කෘතියටයි.
(5) මාධ්‍ය සාක්ෂරතාවටයි.

**23.** ගැමි මාධ්‍ය සම්බන්ධ පහත ලක්ෂණ සලකන්න.
*A* - බොහෝවිට වාචික වේ.
*B* - නිශ්චිත අනන්‍යතාවක් පවතී.
*C* - එක් හැඩයකින් පමණක් යුක්ත වේ.
*D* - ඒ ඒ ප්‍රදේශවලට ආවේණික වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ
(1) *A* හා *B* පමණි. (2) *A* හා *D* පමණි.
(3) *B* හා *C* පමණි. (4) *B* හා *D* පමණි.
(5) *C* හා *D* පමණි.

**24.** ආයතනයක බාහිර මහජන සම්බන්ධතා සඳහා ගැළපෙන මෙවලම් හා විධික්‍රම ඇතුළත් වරණය තෝරන්න.
(1) ප්‍රදර්ශන, ඡායාරූප, අනුග්‍රාහකත්වය, ඍජු ඇමතුම් අංක
(2) ප්‍රකාශන, ජංගම ප්‍රදර්ශන, පුවත් හසුන, දැන්වීම් පුවරුව
(3) සුබසාධක සමිති, ඡායාරූප, ප්‍රදර්ශන, ඍජු ඇමතුම් අංක
(4) පුවත් හසුන, දැන්වීම් පුවරුව, තිළිණ ලබා දීම, මාධ්‍ය සාකච්ඡා
(5) තරග සංවිධානය, සුබසාධක සමිති, ඡායාරූප, අනුග්‍රාහකත්වය

**25.** මාධ්‍ය අභිසාරිතාව පිළිබඳ විග්‍රහයේදී අදාළ **නොවන** වාක්‍ය ඛණ්ඩය කුමක් ද?
(1) මාධ්‍ය සමූහයක් කේන්ද්‍රගත වීම
(2) ඩිජිටල් අවකාශය තුළ වර්ධනයක් සිදුවීම
(3) පුරවැසි මාධ්‍ය අවස්ථා සංකෝචනය වීම
(4) සංදේශ ව්‍යාප්තියට පුළුල් අවකාශයක් නිර්මාණය වීම
(5) අන්තර්ජාල ව්‍යාප්තිය මගින් ජනමාධ්‍ය ප්‍රවර්ධනය වීම

## C කොටස

**26.** 'ආගමික බැඳීම්වලින් තුන්වන ලෝකයේ විමුක්තිය ලබාගැනීම' යන සංවර්ධනය හා සම්බන්ධ සංකල්පය ඉදිරිපත් කරන ලද්දේ,
(1) එඩ්ගා ඕවන්ස් ය. (2) ශ්‍රීනිවාස් මෙල්කොට් ය.
(3) මහත්මා ගාන්ධි ය. (4) සිල්වියෝ වයිස්බෝඩ් ය.
(5) එවරට් රෝජර්ස් ය.

**27.** චිත්‍රපටයක් තිරගත කිරීමට පෙර අවසර ලබාගත යුතු ආයතනය කුමක් ද?
(1) චිත්‍රපට සංස්ථාව (2) ජනමාධ්‍ය අමාත්‍යාංශය
(3) රජයේ චිත්‍රපට අංශය (4) සංස්කෘතික අමාත්‍යාංශය
(5) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය

**28.** මාධ්‍ය නියෝජිතයන් මැදිහත් වීමක් සහිත නීතිය මගින් ස්ථාපිත නියාමනය වන්නේ
(1) ස්වයං නියාමනයයි. (2) මාධ්‍ය නියාමනයයි.
(3) සහ නියාමනයයි. (4) අභ්‍යන්තරික නියාමනයයි.
(5) ව්‍යවස්ථාපිත නියාමනයයි.

**29.** ජනමාධ්‍ය මගින් ලබාදෙන තොරතුරු සියල්ල ජනතාව පිළිගන්නේ හෝ ප්‍රතික්ෂේප කරන්නේ හෝ මතක තබා ගන්නේ හෝ නැති බව ගුරුතුමිය පැහැදිලි කළා ය. මෙම තත්ත්වය HUB ආකෘතියට අනුව වඩාත් හොඳින් පැහැදිලි වන්නේ පහත කවර අංගය මගින් ද?

(1) නියාමනය
(2) දොරටුපාලනය
(3) කේතකරණය
(4) පෙරහනු
(5) මාධ්‍ය විස්තාරණය

**30.** පහත ප්‍රකාශ සලකන්න.

*A* - ඉලක්ක හඳුනාගනියි.
*B* - කාර්යය සැලසුම් කරයි.
*C* - කාර්යය සංවිධාන කරයි.
*D* - මාධ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් මෙහෙයවයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් සිද්ධි කළමනාකරුවකුගේ භූමිකාවට ඍජුව අදාළ වන්නේ

(1) *A* හා *B* පමණි.
(2) *A*, *B* හා *C* පමණි.
(3) *B* හා *C* පමණි.
(4) *B*, *C* හා *D* පමණි.
(5) *C* හා *D* පමණි.

**31.** මාධ්‍ය ආයතන සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි විභාග කිරීමේදී අධිකරණ බලතල අර්ධ වශයෙන් හිමි වන්නේ කාටද?

(1) ප්‍රධාන කතුවරයාට
(2) ඔම්බුඩ්ස්මන්වරයාට
(3) පුවත්පත් මණ්ඩලයට
(4) පුවත් නිසි බලධරයාට
(5) පුවත්පත් පැමිණිලි කොමිසමට

**32.** සමීක්ෂණයකදී සමස්ත ජනගහනය නියෝජනය වන පරිදි තෝරාගන්නා කුඩා කොටස හඳුන්වන්නේ

(1) මාතය ලෙසය.
(2) දත්තය ලෙසය.
(3) මූලාශ්‍රය ලෙසය.
(4) නියැදිය ලෙසය.
(5) මධ්‍යන්‍යය ලෙසය.

**33.** ග්‍රැහැම් වොලස් දක්වන ආකාරයට නිර්මාණාත්මක චින්තන ක්‍රියාදාමයට අයත් අදියර වන්නේ

(1) සකස් කිරීම, පෝෂණය, ප්‍රදීපනය හා සත්‍යාපනයයි.
(2) සකස් කිරීම, පෝෂණය, සංවේදනය හා සත්‍යාපනයයි.
(3) කුතුහලය, සංවේදනය, සධුගමනය හා සම්බන්ධතාවයි.
(4) සකස් කිරීම, පෝෂණය, සම්බන්ධතාව හා සත්‍යාපනයයි.
(5) සකස් කිරීම, පෝෂණය, ප්‍රදීපනය හා සංවේදනයයි.

**34.** නිවස සුද්ධ-පවිත්‍ර කිරීමේ කාර්යය සඳහා උදව්වන ලෙස මව සිය පුතු නවීන්ගෙන් ඉල්ලා සිටියා ය. "දැන් නම් මට බෑ. මේ මගේ ආසම කාටූන් එක බලන වෙලාව" රූපවාහිනිය නරඹමින් සිටි නවීන්ගේ පිළිතුර විය. එම පිළිතුරෙහි අන්තර්ගතය සමග ඍජුව සම්බන්ධ වන්නේ

(1) අපසරණයයි.
(2) ප්‍රජානනයයි.
(3) සංජානනයයි.
(4) නිශ්කර්ෂණයයි.
(5) සහසම්බන්ධයයි.

**35.** පෙර පාසලේ සිට විශ්ව විද්‍යාල මට්ටම දක්වාත් වැඩිහිටි අධ්‍යාපනය තුළත් මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් ආරම්භ කළ යුතු බව සඳහන් ප්‍රකාශය කුමක් ද?

(1) ජිනීවා ප්‍රකාශය
(2) පැරිස් ප්‍රකාශය
(3) ග්‍රෑන්වල්ට් ප්‍රකාශය
(4) කොළඹ ප්‍රකාශය
(5) දිල්ලි ප්‍රකාශය

**36.** සමීක්ෂණ භාවිතයේ වාසියක් වන්නේ

(1) සෑමවිටම සත්‍ය තොරතුරු රැස්කරගත හැකි වීමයි.
(2) අතීත සිදුවීම් පිළිබඳ තොරතුරු ලබාගත හැකි වීමයි.
(3) සංකීර්ණ ගැටලු සම්බන්ධයෙන් ද පුද්ගල අදහස් ලබාගත හැකි වීමයි.
(4) ප්‍රතිචාරකයින් සෑමවිටම අපක්ෂපාතීව තොරතුරු සැපයීමයි.
(5) ප්‍රතිචාරකයින් විශාල ප්‍රමාණයකින් දත්ත ලබාගත හැකි වීමයි.

**37.** පාසල් අධ්‍යාපනය ඉලක්ක කරගනිමින් අධ්‍යාපනික වැඩසටහන් විකාශය කිරීම සඳහා ඒකාබද්ධ විශේෂ රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකා ද්විත්වයක් ආරම්භ කෙරිණි. මෙම ප්‍රවණතාව වන්නේ

(1) නිර්මහාපරිමාණකරණයයි. (2) මාධ්‍ය අභිසාරිතාවයි.
(3) පරිභෝජ්‍යකරණයයි. (4) වේගවත් සංදේශකරණයයි.
(5) නිර්නියාමනයයි.

**38.** ඔබ විසින් ගත් ඡායාරූපයක් අවසරයකින් තොරව වෙනත් පාර්ශ්වයක් විසින් පෞද්ගලික ප්‍රතිලාභයක් උදෙසා යොදාගන්නේ යැයි සිතන්න. මෙහිදී ඔබට සාධාරණය ඉටු කරගත හැක්කේ

(1) පුවත්පත් මණ්ඩල පනත මගිනි.
(2) තොරතුරු දැනගැනීමේ පනත මගිනි.
(3) බුද්ධිමය දේපළ පනත මගිනි.
(4) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය මගිනි.
(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (අ) වගන්තිය මගිනි.

**39.** තම විභාග ප්‍රතිඵල දැනගත් විගස සුරේෂ්ගේ නෙතට සතුටු කඳුළක් නැගුණි. චිත්‍රපටයකදී මෙවැනි අවස්ථාවක රූගත කිරීම සඳහා වඩාත් යෝග්‍ය වන්නේ

(1) දුර රූපයයි. (2) සමීප රූපයයි.
(3) මධ්‍ය සමීප රූපයයි. (4) මධ්‍යම රූපයයි.
(5) අති සමීප රූපයයි.

**40.** පහත කරුණු සලකන්න.

*A* - කළමනාකරණ කාර්යයකි.
*B* - ආයතන ප්‍රතිරූපය වර්ධනය කිරීමේ කාර්යයකි.

ඉහත කරුණු අදාළ වන්නේ

(1) *A* මහජන සම්බන්ධතාවට ය. *B* සිද්ධි කළමනාකරණයට ය.
(2) *A* සිද්ධි කළමනාකරණයට ය. *B* මහජන සම්බන්ධතාවට ය.
(3) *A* හා *B* දෙකම මහජන සම්බන්ධතාවට ය.
(4) *A* හා *B* දෙකම සිද්ධි කළමනාකරණයට ය.
(5) *A* හා *B* දෙකම මහජන සම්බන්ධතාවට හා සිද්ධි කළමනාකරණයට යන දෙකටම ය.

**41.** යම් නිෂ්පාදනයක් අලෙවි කිරීමේදී ඒ සඳහා විශේෂ වට්ටමක් ලබාදෙන බවට මාධ්‍ය මගින් ප්‍රචාරණයක් සිදු කිරීම,

(1) ව්‍යාපාර මහජන සම්බන්ධතාවයි. (2) රාජ්‍ය මහජන සම්බන්ධතාවයි.
(3) වෘත්තීය මහජන සම්බන්ධතාවයි. (4) මාධ්‍ය මහජන සම්බන්ධතාවයි.
(5) ආයතනික මහජන සම්බන්ධතාවයි.

**42.** නිර්මාණාත්මක සන්නිවේදනය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) නිර්මාණයක් බිහි කිරීමේ හැකියාව පරිකල්පනයයි.
(2) අපූර්ව යමක් ගොඩනැගීමට ඇති හැකියාව සතතාභ්‍යාසයයි.
(3) මනසේ නව සිතුවිලි හා අදහස් නිපදවීමට ඇති හැකියාව ප්‍රතිභාවයි.
(4) පවත්නා අදහස් නැවත සකස් කිරීම නිර්මාණාත්මක චින්තනයයි.
(5) යම් කුසලතාවක් වර්ධනය කරගැනීම සඳහා නිරන්තර පුහුණු වීම ව්‍යුත්පත්තියයි.

**43.** චිත්‍රපටයක් ප්‍රදර්ශනය සඳහා U සහතිකයක් නිකුත් කිරීමෙන් අදහස් වන්නේ

(1) වැඩිහිටියන්ට වඩාත් සුදුසු බවයි.
(2) වැඩිහිටියන්ට පමණක් බවයි.
(3) අසීමාන්තික මහජන ප්‍රදර්ශනයට සුදුසු බවයි.
(4) වයස 18ට වැඩි ඕනෑම අයෙකුට නැරඹිය හැකි බවයි.
(5) වැඩිහිටියන් සමඟ පැමිණෙන වයස 18ට අඩු ළමුන්ට ද නැරඹිය හැකි බවයි.

- ප්‍රශ්න අංක **44** සහ **45** සඳහා පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

ඉගෙනුම් කාර්යය සඳහා පන්තියක ළමුන් සහභාගි වන ආකාරය පහත පරිදි වේ.

| | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| භෞතිකව | 05 | 12 | 16 | 12 | 10 |
| මාර්ගගතව | 15 | 08 | 04 | 08 | 10 |

**44.** සතිය තුළදී භෞතිකවත් මාර්ගගතවත් ඉගෙනුම් කාර්යය සඳහා සිසුන් සහභාගි වීමේ මධ්‍යන්‍ය අගයන් පිළිවෙළින්,
(1) 05, 04 (2) 55, 45 (3) 12, 08 (4) 16, 04 (5) 11, 09

**45.** සිසුන් භෞතිකවත් මාර්ගගතවත් පන්තියට සහභාගීවීමේ මාතය දැක්වෙන දින පිළිවෙළින්,
(1) සඳුදා හා බ්‍රහස්පතින්දා ය. (2) බදාදා හා සඳුදා ය.
(3) අඟහරුවාදා හා බදාදා ය. (4) අඟහරුවාදා හා සිකුරාදා ය.
(5) බදාදා හා සිකුරාදා ය.

**46.** විභාග ප්‍රතිඵල නිකුත් වූ සැනින් මීනා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිස තම ප්‍රතිඵලය පරීක්ෂා කළාය. එහිදී ඇයට උපයෝගී වූ නව මාධ්‍ය ලක්ෂණ වන්නේ
(1) ජාලගතකරණය, වේගවත් සංදේශකරණය හා දත්ත සංචිතකරණයයි.
(2) අධිපාඨනීයත්වය, වේගවත් සංදේශකරණය හා දත්ත සංචිතකරණයයි.
(3) ජාලගතකරණය, අන්තර් ක්‍රියාකාරිත්වය හා අධිපාඨනීයත්වයයි.
(4) ස්වයංකරණය, අධිපාඨනීයත්වය හා ජාලගතකරණයයි.
(5) අන්තර් ක්‍රියාකාරිත්වය, ස්වයංකරණය හා වේගවත් සංදේශකරණයයි.

**47.** මාධ්‍ය සංදේශ තුළ ඇති වැදගත් කරුණු කෙටියෙන් හා පැහැදිලිව ග්‍රහණය කරගැනීම සඳහා විචාරශීලී ග්‍රාහකයකු සතු කුසලතාව,
(1) තක්සේරුකරණයි. (2) සංස්ලේෂණයයි. (3) විශ්ලේෂණයයි.
(4) කාණ්ඩකරණයයි. (5) වියුක්තිකරණයයි.

**48.** සංස්කෘතිය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
*A* - මානව වර්ගයාගේ ඉතිහාසයේ සිට අද දක්වාම පවතී.
*B* - නොගැඹුරු, සරල සහ මහා පරිමාණ නිෂ්පාදන යන ලක්ෂණවලින් සමන්විතයි.
*C* - ජනතාවගේ ශ්‍රම ක්‍රියාකාරිත්වය සමඟ අවියෝජනීය සබඳතාවක් පවතී.
*D* - විඥාපන, දෘෂ්ටිවාදී, නිර්මාණාත්මක හා සන්නිවේදනාත්මක සමාජ කාර්යයක් ඉටු කරයි.
ඉහත ප්‍රකාශවලට අදාළ සංස්කෘතික ප්‍රභේද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) සාම්ප්‍රදායික, ජන, ජනප්‍රිය හා මාධ්‍ය
(2) සාම්ප්‍රදායික, ජනප්‍රිය, ජන හා මාධ්‍ය
(3) ජන, සාම්ප්‍රදායික, මාධ්‍ය හා ජනප්‍රිය
(4) ජන, මාධ්‍ය, සාම්ප්‍රදායික හා ජනප්‍රිය
(5) මාධ්‍ය, සාම්ප්‍රදායික, ජනප්‍රිය හා ජන

**49.** පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | X | | Y |
|---|---|---|---|
| 1 | සමාජ මාධ්‍ය | A | ව්‍යාප්තිය කෙරෙහි අභිසාරිතාව හේතු වේ. |
| 2 | නව මාධ්‍ය | B | නිල පණිවිඩ බෙදාහැරීම සඳහා භාවිත වේ. |
| 3 | ලින්ක්ඩ්ඉන් (LinkedIn) | C | වෘත්තීය ජාලගතකරණය සඳහා භාවිත වේ. |
| 4 | ට්විටර් (Twitter) | D | නව මාධ්‍යවල දියුණු අවස්ථාවකි. |

ඉහත X හා Y අතර නිවැරදි ගැළපීම පෙන්නුම් කරන වරණය කුමක් ද?
(1) 1D, 2B, 3C, 4A (2) 1A, 2B, 3D, 4C
(3) 1D, 2A, 3C, 4B (4) 1B, 2C, 3A, 4D
(5) 1C, 2A, 3D, 4B

**50.** පුද්ගලයකුගේ පෝෂණය, සනීපාරක්ෂාව, ඉඳුම්-හිටුම් පහසුකම් සහ මානව හිමිකම් වැනි සාධක ඉටු කරගැනීම සඳහා සන්නිවේදනය යොදාගැනීම හඳුනාගත යුත්තේ
(1) ස්වයං නිර්ණය ලෙසයි.
(2) ප්‍රජා සහභාගිත්ව වර්ධනය ලෙසයි.
(3) සංවර්ධන සන්නිවේදන අපේක්ෂා ලෙසයි.
(4) අවශ්‍යතා කේන්ද්‍රීයත්වය ලෙසයි.
(5) පරිසර විද්‍යාත්මක සමබරතාව ලෙසයි.

2.3 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය

වගුව **2.1 ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | ප්‍රශ්න අංකය | නිවැරදි වරණය |
|---|---|---|---|
| **01** | **5** | **26** | **2** |
| **02** | **1** | **27** | **5** |
| **03** | **4** | **28** | **3** |
| **04** | **4** | **29** | **4** |
| **05** | **3** | **30** | **2** |
| **06** | **5** | **31** | **3** |
| **07** | **4** | **32** | **4** |
| **08** | **3** | **33** | **1** |
| **09** | **4** | **34** | **4** |
| **10** | **3** | **35** | **3** |
| **11** | **4** | **36** | **5** |
| **12** | **1** | **37** | **1** |
| **13** | **2** | **38** | **3** |
| **14** | **2** | **39** | **5** |
| **15** | **3** | **40** | **5** |
| **16** | **2** | **41** | **1** |
| **17** | **1** | **42** | **4** |
| **18** | **2** | **43** | **3** |
| **19** | **5** | **44** | **5** |
| **20** | **3** | **45** | **2** |
| **21** | **5** | **46** | **1** |
| **22** | **5** | **47** | **2** |
| **23** | **2** | **48** | **2** |
| **24** | **1** | **49** | **3** |
| **25** | **3** | **50** | **4** |

***** ප්‍රතිචාර නොදැක් වූ හෝ එක් වරණයකට වඩා ප්‍රතිචාර දක්වා ඇති අපේක්ෂක ප්‍රතිශතය**

මූලාශ්‍රය: අ.පො.ස.(උ.පෙළ) **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය** ලකුණු දීමේ පටිපාටිය, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

## 2.4 I පත්‍රයේ වරණ තෝරා ඇති ආකාරය

වගුව 2.2

එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති අපේක්ෂක ප්‍රතිශතය

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ගෙන ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය | | | | | *** |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | |
| 1 | 5 | 12.31 | 6.20 | 2.51 | 15.22 | 63.29 | 0.47 |
| 2 | 1 | 62.04 | 28.47 | 4.63 | 1.18 | 3.45 | 0.24 |
| 3 | 4 | 6.98 | 14.35 | 47.29 | 25.88 | 4.94 | 0.55 |
| 4 | 4 | 17.41 | 6.67 | 5.10 | 67.61 | 2.98 | 0.24 |
| 5 | 3 | 2.20 | 2.59 | 59.84 | 9.65 | 25.33 | 0.39 |
| 6 | 5 | 12.55 | 31.69 | 5.18 | 12.08 | 37.80 | 0.71 |
| 7 | 4 | 13.88 | 11.06 | 10.59 | 49.10 | 15.06 | 0.31 |
| 8 | 3 | 29.96 | 18.20 | 43.14 | 2.67 | 5.73 | 0.31 |
| 9 | 4 | 8.86 | 21.33 | 19.06 | 44.55 | 5.65 | 0.55 |
| 10 | 3 | 0.86 | 18.04 | 22.90 | 2.59 | 55.22 | 0.39 |
| 11 | 4 | 8.71 | 14.90 | 17.88 | 52.63 | 5.49 | 0.39 |
| 12 | 1 | 70.90 | 13.88 | 2.75 | 4.39 | 8.00 | 0.08 |
| 13 | 2 | 13.88 | 31.06 | 15.76 | 15.69 | 23.22 | 0.39 |
| 14 | 2 | 2.98 | 69.57 | 2.75 | 4.16 | 20.55 | 0.00 |
| 15 | 3 | 14.98 | 6.75 | 18.04 | 50.12 | 9.65 | 0.47 |
| 16 | 2 | 23.92 | 29.73 | 13.25 | 15.76 | 17.02 | 0.31 |
| 17 | 1 | 41.49 | 17.18 | 4.24 | 15.76 | 20.94 | 0.39 |
| 18 | 2 | 4.47 | 21.96 | 13.65 | 27.29 | 32.55 | 0.08 |
| 19 | 5 | 5.80 | 5.88 | 8.71 | 9.41 | 69.88 | 0.31 |
| 20 | 3 | 27.37 | 18.59 | 29.65 | 9.25 | 14.75 | 0.39 |
| 21 | 5 | 21.57 | 14.67 | 25.80 | 15.45 | 22.20 | 0.31 |
| 22 | 5 | 15.45 | 10.67 | 15.14 | 6.98 | 51.14 | 0.63 |
| 23 | 2 | 3.37 | 63.84 | 3.14 | 26.67 | 2.67 | 0.31 |
| 24 | 1 | 37.49 | 14.75 | 11.29 | 20.16 | 16.00 | 0.31 |
| 25 | 3 | 7.92 | 11.37 | 56.47 | 9.57 | 14.20 | 0.47 |
| 26 | 2 | 14.59 | 38.27 | 28.31 | 10.43 | 7.76 | 0.63 |
| 27 | 5 | 18.12 | 7.76 | 8.86 | 8.86 | 56.08 | 0.31 |
| 28 | 3 | 5.25 | 34.12 | 30.27 | 7.14 | 22.82 | 0.39 |
| 29 | 4 | 6.90 | 8.47 | 7.22 | 55.37 | 21.73 | 0.31 |
| 30 | 2 | 10.90 | 55.14 | 15.29 | 14.51 | 3.84 | 0.31 |
| 31 | 3 | 7.53 | 40.86 | 18.59 | 7.14 | 25.18 | 0.71 |
| 32 | 4 | 6.04 | 12.24 | 4.39 | 69.80 | 7.06 | 0.47 |
| 33 | 1 | 49.18 | 18.12 | 14.04 | 9.57 | 8.78 | 0.31 |
| 34 | 4 | 17.96 | 7.69 | 18.43 | 31.92 | 23.37 | 0.63 |
| 35 | 3 | 9.73 | 6.20 | 78.90 | 2.51 | 2.27 | 0.39 |
| 36 | 5 | 16.55 | 12.16 | 27.14 | 5.41 | 38.35 | 0.39 |
| 37 | 1 | 36.63 | 34.20 | 7.22 | 16.63 | 4.94 | 0.39 |
| 38 | 3 | 2.20 | 5.18 | 51.06 | 32.47 | 8.63 | 0.47 |
| 39 | 5 | 2.12 | 27.37 | 17.96 | 3.69 | 48.55 | 0.31 |
| 40 | 5 | 6.82 | 31.22 | 18.90 | 13.25 | 29.41 | 0.39 |
| 41 | 1 | 72.16 | 2.59 | 3.76 | 12.71 | 8.63 | 0.16 |
| 42 | 4 | 22.04 | 12.39 | 36.78 | 22.35 | 6.12 | 0.31 |
| 43 | 3 | 9.25 | 15.22 | 44.39 | 14.98 | 15.69 | 0.47 |
| 44 | 5 | 5.10 | 13.25 | 15.29 | 26.43 | 39.84 | 0.08 |
| 45 | 2 | 6.75 | 57.88 | 11.92 | 12.78 | 10.43 | 0.24 |
| 46 | 1 | 64.94 | 11.06 | 8.00 | 6.27 | 9.25 | 0.47 |
| 47 | 2 | 8.47 | 24.86 | 38.51 | 10.90 | 17.02 | 0.24 |
| 48 | 2 | 18.82 | 58.67 | 9.18 | 10.27 | 2.90 | 0.16 |
| 49 | 3 | 8.86 | 4.47 | 64.00 | 8.55 | 13.73 | 0.39 |
| 50 | 4 | 10.04 | 3.92 | 17.18 | 62.75 | 5.88 | 0.24 |

මූලාශ්‍රය: පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.



*** ප්‍රතිචාර නොදැක්වූ හෝ එක් වරණයකට වඩා ප්‍රතිචාර දක්වා ඇති අපේක්ෂක ප්‍රතිශතය

## 2.5 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක

ප්‍රස්තාරය 2.1
**I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක**




මූලාශ්‍රය : RD/16/5/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021 ශ්‍රී.ලං.වි.දෙ.

## 2.6 I පත්‍රයේ විශ්ලේෂණය

### ප්‍රශ්න අංක 3

03 ප්‍රශ්නයේ පහසුතාව 25.88% වේ. මෙම ප්‍රශ්නය සංවර්ධනය සඳහා සන්නිවේදනය (13 ශ්‍රේණිය - 9 වන පාඩම) ඇසුරින් ලබා දී ඇත. එහි නිවැරදි පිළිතුර වන්නේ 4 වරණයයි. (දෙපියවර සංකල්පයෙනි) අපේක්ෂකයන්ගෙන් 25.88%ක් නිවැරදි වරණය තෝරාගෙන ඇත. නමුත් අපේක්ෂකයන් 47.29%ක් පිළිතුර ලෙස 3 වරණය (දොරටුපාල සංකල්පයෙනි) තෝරා ගෙන ඇත. ජනමාධ්‍ය සන්දේශ හා ජනමත ප්‍රධානීන් අතර සම්බන්ධය පැහැදිලි කරන ප්‍රකාශය පිළිබඳ ව ප්‍රශ්නයෙන් විමසා ඇති නමුත් අපේක්ෂකයන් ප්‍රශ්නය නිවැරදි ව අවබෝධ කර නොගැනීම හේතුවෙන් වැරදි වරණය තෝරාගෙන ඇතැයි සිතිය හැකිය. සිසුන්ට නිවැරදි අවබෝධයක් ලබාදීම සඳහා පන්ති කාමරය තුළදී ප්‍රායෝගික නිදර්ශන ඇසුරින් මෙම සංකල්පයන්හි විවිධත්වය පිළිබඳ අවබෝධය ලබා දීම මෙම ගැටලුවට සාධනීය විසඳුමක් වේ යැයි අපේක්ෂා කළ හැකිය.

### ප්‍රශ්න අංක 10

10 ප්‍රශ්නයේ පහසුතාව 22.90% වේ. 10 ප්‍රශ්නය සන්නිවේදන පදනම (12 ශ්‍රේණිය - 2 වන පාඩම) කේත ඇසුරෙන් ලබා දී ඇත. එහි නිවැරදි පිළිතුර 3 වරණයයි. (වෙනත් යමක් නියෝජනය කරන්නකි) නමුත් අපේක්ෂකයන්ගෙන් 55.22%ක් ම 5 වරණය (ශබ්ද නොව රූප නියෝජනය කරන්නකි) තෝරාගෙන ඇත. ශබ්ද සංකේත සම්බන්ධයෙන් බොහෝ අපේක්ෂකයන්ගේ අවබෝධය ප්‍රමාණවත් නොවීම මෙම වැරදි වරණය තෝරා ගැනීමට හේතු වූවා විය හැකිය. මෙවැනි සංකල්ප පිළිබඳ න්‍යායාත්මක කරුණු, ප්‍රායෝගික භාවිතයන් සහ නිදර්ශන යොදා ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගැනීමේ අවශ්‍යතාව පෙන්වාදිය හැකිය.

### ප්‍රශ්න අංක 15

15 ප්‍රශ්නයේ පහසුතාව 18.04% වේ. මෙම ප්‍රශ්නය සාම්ප්‍රදායික මාධ්‍ය හා ජනමාධ්‍ය, නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය (12 ශ්‍රේණිය - 4 පාඩම) ඇසුරින් ලබා දී ඇත. එහි නිවැරදි පිළිතුර වන්නේ 3 වරණයයි. (ග්‍රාහක අවශ්‍යතාවලට අනුකූල වීම) නමුත් අපේක්ෂකයන්ගෙන් 50.12% ක් තරම් වැඩිම ප්‍රතිශතයක් 4 වරණය (සමාජ උරුමයන් පවරා දීම) තෝරා ගෙන ඇත. බොහෝ අපේක්ෂකයන් විසින් ජනමාධ්‍යයේ කාර්යභාරය නිවැරදි ව ග්‍රහණය කර නොගැනීම වැරදි වරණය තෝරා ගැනීමට හේතු වී යැයි සිතිය හැකිය.

### ප්‍රශ්න අංක 18

18 ප්‍රශ්නයේ පහසුතාව 21.96% වේ. මෙම ප්‍රශ්නය සන්නිවේදන ප්‍රභේද ඇසුරින් ලබා දී ඇත. එහි නිවැරදි පිළිතුර 2 වරණයයි. (අන්තර් පුද්ගල සන්නිවේදනය ඒක මාර්ගිකවද සිදුවේ) නමුත් 5 වරණය (අන්තර් පුද්ගල සන්නිවේදනය ද්වීපාර්ශ්විකව පමණක් සිදුවේ) 32.55%ක ප්‍රතිශතයක් ද, 4 වරණය (සමූහ සන්නිවේදනය ග්‍රාහක සංඛ්‍යාව මත පමණක් පදනම් වේ) 27.29% ක් ද තෝරා ගෙන ඇත. අන්තර් පුද්ගල සන්නිවේදනය පිළිබඳ ව බොහෝ අපේක්ෂකයන් තුළ ප්‍රමාණවත් අවබෝධයක් නොපැවතීම වැරදි වරණ තෝරාගැනීමට හේතු වූවා යැයි සිතිය හැකිය.

එමෙන් ම ග්‍රාහක සංඛ්‍යාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම ද වැරදි පිළිතුර තෝරා ගැනීම සඳහා තවත් හේතුවක් විය හැකිය. ප්‍රායෝගික අවස්ථා හා සිද්ධි ඇසුරින් පාඩම සංවිධානය කිරීමෙන් මෙම තත්ත්වය අවම කර ගැනීමට හැකි වේ යැයි සිතිය හැකිය.

**ප්‍රශ්න අංක 21**

21 ප්‍රශ්නයේ පහසුතාව 22.20% වේ. මෙම ප්‍රශ්නය A B C ලෙස නම් කර ඇති සන්නිවේදන ආකෘති (12 ශ්‍රේණිය) ඇසුරෙන් ලබා දී ඇත. එහි නිවැරදි පිළිතුර 5 වරණයයි (C මගිනි) මෙහිදී සිද්ධියක් ඇසුරින් ආකෘති පිළිබඳ තර්කානුකූල විමසීමක් සිදු කර ඇත. ලබා දී ඇති සිද්ධි අතර තාර්කිකත්වය නිවැරදි ව වටහා නොගැනීම නිසා අපේක්ෂකයන් වැරදි වරණ තෝරාගෙන ඇතැයි උපකල්පනය කළ හැකිය. මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා පන්ති කාමරය තුළ දී ආකෘති පිළිබඳ මූලිකාංග සහ ලක්ෂණවලට පමණක් සීමා නොවී ප්‍රායෝගික ජීවිතයේ අත්දැකීම් හා සම්බන්ධ කර ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම වැදගත් වේ.

**ප්‍රශ්න අංක 31**

31 ප්‍රශ්නයේ පහසුතාව 18.59% වේ. මෙම ප්‍රශ්නය, සන්නිවේදන ප්‍රතිපත්ති හා මාධ්‍ය නියාමනය (13 ශ්‍රේණිය - 10 පාඩම) ඇසුරින් ලබා දී ඇත. ඒ සඳහා නිවැරදි පිළිතුර වන 3 වරණය (පුවත්පත් මණ්ඩලයට) තෝරා ගැනීම 18.59% කි. අපේක්ෂකයන් 40.86% ක් 2 වරණය (ඔම්බුඩ්ස්මන්ට් වරයාට) තෝරා ගෙන ඇත. මාධ්‍ය නියාමන ආයතන හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ අඩු අවබෝධය වැරදි වරණය තෝරා ගැනීමට හේතු විය හැකිය. මාධ්‍ය නියාමන ආයතන සම්බන්ධයෙන් නිශ්චිත කරුණු තහවුරු වන පරිදි පාඩම් සැලසුම්කරණය සංවිධානය කළ යුතු බව යෝජනා කෙරේ.

**ප්‍රශ්න අංක 35**

35 ප්‍රශ්නයේ පහසුතාව 78.90% ක් වේ. මෙම ප්‍රශ්නය සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය හා විකාශය පාඩම (12 ශ්‍රේණිය - 1 වන පාඩම) ඇසුරින් සැකසී ඇත. එහි නිවැරදි පිළිතුර 3 වරණයයි. (ගෲන්වර්ල්ට් ප්‍රකාශය) එම පිළිතුර තෝරා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 78.90% කි. විෂය නිර්දේශයේ දැනුම හා සම්බන්ධ ඍජුව අසා ඇති ප්‍රශ්නයක් වීම මෙම ප්‍රශ්නයේ ඉහළ පහසුතා අගයට හේතුවක් විය හැකිය.

**ප්‍රශ්න අංක 42**

42 ප්‍රශ්නයේ පහසුතාව 22.35% වේ. මෙම ප්‍රශ්නය නිර්මාණාත්මක සන්නිවේදනය (13 ශ්‍රේණිය - 7 පාඩම) ඇසුරින් ලබා දී ඇත. නිවැරදි පිළිතුර 4 වරණය (පවත්නා අදහස් නැවත සකස් කිරීම නිර්මාණාත්මක චින්තනයයි) වේ. නමුත් 1 වරණය (නිර්මාණයක් බිහිකිරීමේ හැකියාව පරිකල්පනයයි) නිවැරදි පිළිතුර ලෙස 22.04% ක් ද, 2 වරණය (අපූරු යමක් ගොඩනැගීමට ඇති හැකියාව සතතාභ්‍යාසයයි) නිවැරදි පිළිතුර ලෙස 12.39% ක් ද, නිවැරදි පිළිතුර (මනසේ නව සිතුවිලි හා අදහස් නිපදවීමට ඇති හැකියාව ප්‍රතිභාවයි) ලෙස 3 වරණය 22.35%ක් ද තෝරා ගෙන ඇත. අපේක්ෂකයන් තුළ නිර්මාණාත්මක සන්නිවේදනය පිළිබඳ පවතින ප්‍රමාණවත් අවබෝධයක් නොපැවති වැරදි වරණ තෝරා ගැනීමට හේතු වූවා යැයි සිතිය හැකිය.

**ප්‍රශ්න අංක 47**

47 ප්‍රශ්නයේ පහසුතාව 24.86% වේ. මෙම ප්‍රශ්නය මාධ්‍ය සාක්ෂරතාව හා මාධ්‍ය විචාරය (12 ශ්‍රේණිය - 6 පාඩම) ඇසුරින් ලබා දී ඇත. එහි නිවැරදි පිළිතුර වන 2 වරණය (සංස්ලේෂණය) තෝරා ගැනීම 24.86% කි. නමුත් නිවැරදි පිළිතුර 3 වරණය (විශ්ලේෂණය) තෝරාගත් අපේක්ෂකයින් 38.51% කි. සාක්ෂරතාව සම්බන්ධ පාරිභාෂිත පද පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය අඩුවීම වැරදි වරණ තෝරා ගැනීමට හේතු වූවා යැයි සිතිය හැකිය. එබැවින් පාරිභාෂිත පදයන්හි විවිධත්වය තහවුරු වන අන්දමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සුදුසු යැයි යෝජනා කළ හැකිය.

# III කොටස

## 3. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - II පත්‍රය

### 3.1 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II පත්‍රයේ ව්‍යුහය

- කාලය පැය 03 යි (ඊට අමතරව කියවීමේ කාලය මිනිත්තු 10 යි)
- මෙම ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න හතකි. ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100 කි.

| | | | | | |
|---|---|---|---|---|---|
| අවසාන ලකුණු ගණනය කිරීම = | **I පත්‍රය** | | | = | 50 |
| | **II පත්‍රය** | **=** | **100/2** | **=** | **50** |
| | **අවසාන ලකුණු** | | | **=** | **100** |

**මූලාශ්‍රය** : අ.පො.ස.(උ.පෙ.) විභාගය - 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාගය සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න, 2018 ශ්‍රී.ලං.වි.දෙ

## 3.2 II පත්‍රයේ විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.1**

II පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය සහ එක් එක් ප්‍රශ්නයෙහි පහසුතාව




මූලාශ්‍රය : RD/16/3/AL සහ RD/16/4/AL පත්‍රිකාවලින් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

2021 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II පත්‍රය A හා B යනුවෙන් කොටස් දෙකකි. මෙහි A කොටස පැරණි හා නව නිර්දේශ දෙකටම අයත් වන අතර අන්තර්ගත ප්‍රශ්න තුනකි. B කොටස ප්‍රශ්න අටකින් සමන්විත වෙයි. එහි 4, 5, 6, 7 ප්‍රශ්න පැරණි නිර්දේශයට ද 8, 9, 10, 11 ප්‍රශ්න නව නිර්දේශයට ද අනුව සකස් කර ඇත. මෙහිදී අපේක්ෂකයා විසින් A කොටසෙන් ප්‍රශ්න දෙකක් හා B කොටසින් ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.

A කොටසේ 1, 2, 3 ප්‍රශ්නවලින් වැඩි අපේක්ෂක පිරිසක් තෝරාගෙන ඇත්තේ පළමුවන ප්‍රශ්නයයි. එහි ප්‍රතිශතය 98%ක ඉහළ අගයක් ගනියි. දෙවන ප්‍රශ්නයෙහි තෝරාගැනීම 74%කි. A කොටසට අදාළ 1, 2, 3 ප්‍රශ්න අතුරින් 1 හා 2 ප්‍රශ්නවල පහසුතාව පිළිවෙලින් 72% හා 55% වේ.

B කොටසට අදාළ නව නිර්දේශයට අයත් 8, 9, 10, 11 යන ප්‍රශ්න අතුරින් අටවන ප්‍රශ්නයෙහි පහසුතාව 51% කි. එහි තෝරාගැනීමේ ප්‍රතිශතය 64% කි.

**ප්‍රස්තාරය 3.2**

පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය




මූලාශ්‍රය : RD/16/3/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

දෙවන ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 40කි. A කොටසෙහි පළමුවන ප්‍රශ්නය සඳහා 76-100% පන්ති ප්‍රාන්තරයට අදාළව ලකුණු ලබාගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 34% කි.

A කොටසෙහි දෙවැනි හා තුන්වෙනි ප්‍රශ්න සඳහා 00- 25 පන්ති ප්‍රාන්තරයට අදාළ ලකුණු ලබාගත් අපේක්ෂකයන් සංඛ්‍යාව පිළිවෙලින් 36 % හා 41% කි.

නව නිර්දේශයට අදාලව සකස් කර ලද 8, 9, 10, 11 ප්‍රශ්න සඳහා වැඩිම අපේක්ෂකයන් ප්‍රතිශතයක් ලකුණු ලබා ඇති ප්‍රතිශතය සඳහා වෙන් කළ ලකුණු 00-25% පන්ති ප්‍රාන්තරය තුළ ය.

**ප්‍රස්තාරය 3.3**

II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

## 3.3 II පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා සුවිශේෂී නිරීක්ෂණ හා නිර්දේශ

### 3.3.1 ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර

**A කොටස**

**1.** සන්නිවේදනය සමාජ ක්‍රියාවලියකි.

(i) පාසල තුළ විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන අවස්ථා **දෙකක්** නම් කරන්න.

- පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
- උදෑසන රැස්වීම
- උත්සව (ක්‍රීඩා, ත්‍යාග, වර්ණ ප්‍රදානය)
- ගුරු සාකච්ඡා
- දෙමාපිය හමු / පන්ති කව
- පාසල් සංවර්ධන සමිතිය
- දැන්වීම් පුවරුව
- සමිති (සාහිත්‍ය, විද්‍යාව, මාධ්‍ය ...)
- ප්‍රදර්ශන (විද්‍යා, අධ්‍යාපන ....)
- විෂය බාහිර ක්‍රියාකාරකම් (බලදක්ෂ, ශිෂ්‍යභට, පරිසර නියමු ...)
- මාධ්‍ය ක්‍රියාකාරකම්

***(ලකුණු 2 × 2 = 04)***

(ii) පුද්ගලාන්තර සන්නිවේදනයට අයත් ලක්ෂණ **හතරක්** නම් කර ඉන් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

- පුද්ගලයන් දෙදෙනෙකු අතර සිදුවීම.
- ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණය ක්ෂණිකව සිදුවීම.
- සජීවී බවින් යුක්ත වීම.
- වාචිකව මෙන්ම නිර්වාචිකව ද සන්නිවේදනය සිදුකළ හැකි අතර නිර්වාචික ක්‍රම භාවිතයෙන් වාචික සන්නිවේදනය ප්‍රබල කරගත හැකිවීම.
- සන්නිවේදන බාධක අවම කරගත හැකිවීම.
- තාක්ෂණික උපකරණ භාවිත කළ හැකිවීම.
- මුහුණට මුහුණලා සන්නිවේදනය සිදුවිය හැකිය.
- සන්නිවේදක, ග්‍රාහක භූමිකා හුවමාරුව සිදුවීම.
- පුද්ගල භාවයන් ඉලක්ක කර සන්නිවේදනයේ යෙදීමේ හැකියාව.
- පුද්ගල පෞරුෂය හඳුනාගත හැකිවීම.
- කාලය පිළිබඳ සීමා පැන නැගීම අවමවීම.
- පෙළඹවීම හා බලපෑම ප්‍රබලව සිදු කිරීමට හැකිවීම.
- අන්තර් සබඳතා ශක්තිමත් කර ගැනීමට හේතුවීම.

***නම් කිරීමට ලකුණු 1 × 4 = 04***
***විස්තර කිරීම 2 × 2 = 04***
***මුළු ලකුණු = 08***

(iii) ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය අතර පවත්නා වෙනස්කම් **තුනක්** විස්තර කරන්න.

| ජනමාධ්‍ය | | සමාජ මාධ්‍ය | |
|---|---|---|---|
| 1. | පහසුවෙන් පරිශීලනය කළ හැකිය. | 1. | පරිශීලනය කිරීමට විශේෂ දැනුමක් අවශ්‍ය වේ. (නව මාධ්‍ය සාක්ෂරතාව) |
| 2. | හිමිකාරීත්වය නිශ්චිත වේ. (දෘශ්‍යමාන වේ) | 2. | හිමිකාරීත්වය ඇතැම් විට දෘශ්‍යමාන නොවේ |
| 3. | ප්‍රමාදිත ප්‍රතිපෝෂණයකි. | 3. | ක්ෂණික ප්‍රතිපෝෂණයට අවස්ථාව ඇත. |
| 4. | වාරණය කිරීම පහසුය. | 4. | වාරණය කිරීම අපහසුය. |
| 5. | නියාමනය කිරීම පහසුය. | 5. | නියාමනය කිරීම අපහසුය. |
| 6. | භූගෝලීය සීමා ඇත. | 6. | භූගෝලීය සීමා අතික්‍රමණය කරයි. |
| 7. | වෘත්තිමය සන්නිවේදකයන් සිටී | 7. | පුරවැසියන්ට ද මධ්‍යකරණයේ නිරත වීමට අවස්ථාව ඇත. |
| 8. | තොරතුරු වේගවත්ව බෙදාහැරිය නොහැකිය. | 8. | සාපේක්ෂව තොරතුරු වේගවත්ව හුවමාරු වේ. |
| 9. | ග්‍රාහක අභිමතය පරිදි සන්දේශ පරිශීලනය කළ නොහැකිය. | 9. | තම අභිමතය පරිදි සන්දේශ පරිශීලනය කළ හැකිය. (කැමති වෙලාවක, ස්ථානයක) |
| 10 | සමාජ අන්තර් ක්‍රියාකාරීත්වයට සීමිත අවස්ථාවක් පවතී. | 10. | සමාජ අන්තර් ක්‍රියාකාරීත්වයට වැඩි ඉඩක් පවතී. |
| 11. | අත්‍යවශ්‍ය වූ තොරතුරු කල්ගත වූ පසු පහසුවෙන් සොයා ගැනීමට නොහැකිය. | 11. | අත්‍යවශ්‍ය වූ තොරතුරු කල්ගත වූ පසුත් පහසුවෙන් සොයාගත හැකිය. |
| 12. | විශාල ග්‍රාහක ක්ෂේත්‍රයකට ආමන්ත්‍රණය කරයි. | 12. | විශාල පිරිසකට මෙන්ම කුඩා පිරිසකට ආමන්ත්‍රණය කරයි. |
| 13. | ජන මාධ්‍ය සංදේශ විධිමත්, නිල ස්වභාවයක් ගනී. | 13. | සංදේශ බොහෝ විට නිල ස්වභාවයක් නොගනී. |

*ලකුණු 4 × 3 = 12*

(iv) ඔබ කැමති ජනමාධ්‍යයක් ඇසුරෙන් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග **හතරක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

1. මූලාශ්‍රය
2. සන්නිවේදකයා / ආකේතකරය
3. පණිවිඩය / සංදේශය
4. මාධ්‍ය / නාලිකාව
5. ග්‍රාහකයා / විකේතකරය
6. ප්‍රතිපෝෂණය
7. බාධක / ඝෝෂාව
8. බලපෑම
9. අත්දැකීම් පසුතලය
10. සන්දර්භය
11. ආකේතිකරණය
12. විකේතිකරණය

**(තෝරාගත් එක් ජනමාධ්‍යයක් ඇසුරෙන්, ඉහත මූලිකාංගවලින් හතරක් විස්තර කර තිබිය යුතුය. සුදුසු නිදසුන් දක්වමින් ප්‍රමාණවත් ලෙස කරුණු පැහැදිලි කළ යුතුය)**

*ලකුණු 4 × 4 = 16*

### 3.3.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.4**

ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය




ඉන්
ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 34%ක් ද,
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 හෝ 20ට අඩුවෙන් ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 42%ක් වන අතර ලකුණු 31 හෝ 31 ට වැඩියෙන් ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 34% කි.

මූලාශ්‍රය : RD/16/3/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 3.5**

ප්‍රශ්න අංක 1 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

II පත්‍රයේ A කොටසේ පළමුවන ප්‍රශ්නය වන මෙහි අනුකොටස් හතරකි. මෙම ප්‍රශ්නය 98% අපේක්ෂක ප්‍රතිශතයක් තෝරාගෙන ඇති අතර සමස්ත පහසුතාව 72%කි. (i) කොටසෙහි පහසුතාව 0.89කි. එය එම ප්‍රශ්නයෙහි වැඩිම පහසුතාවක් සහිත ප්‍රශ්න අනුකොටස වේ. අඩුම පහසුතාවක් සහිත ප්‍රශ්න අනුකොටස වන්නේ (iv) කොටසයි. එහි පහසුතාව 0.54කි.

(i) අනුකොටසින් අපේක්ෂා කරන්නේ පාසල තුළ විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන අවස්ථා දෙකක් නම් කිරීමයි. එහි පහසුතාව 0.89කි. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේ දී අසා ඇති ප්‍රශ්නය පිළිබද පැහැදිලි අවබෝධයක් අපේක්ෂකයින් තුළ ඇති බව පෙනේ. තවදුරටත් මේ ආශ්‍රිත දැනුම හා අවබෝධය වර්ධනය කිරීම උදෙසා පන්තිකාමරයේ දී ප්‍රතිපෝෂණ අවස්ථා සකස් කළ හැකිය. එහිදී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා නව තාක්ෂණික ක්‍රමවේදවලට අනුකූල ව ශිෂ්‍යයන්ට විවිධ ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලීමට අවස්ථාව සැලසිය යුතුය. එහිදී විවිධ උත්සව සංවිධානය, උදෑසන රැස්වීම් පැවැත්වීම, විවිධ ආයතනික ක්ෂේත්‍ර චාරිකා සංවිධානය ආදී වූ ක්‍රමවේද භාවිත කළ හැකිය.

(ii) අනුකොටසින් පුද්ගලාන්තර සන්නිවේදනයට අයත් ලක්ෂණ හතරක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් විස්තර කිරීම අපේක්ෂා කර ඇත. එහි පහසුතාව 0.78%කි. මේ ප්‍රශ්නයෙන් විමසා ඇති කරුණු පිළිබඳව අපේක්ෂකයන්ගේ අවබෝධය ඉහළ මට්ටමක පවතී. තවදුරටත් එම මට්ටම සංවර්ධනය උදෙසා පාඩම් සැලසුම්කරණයේ දී කණ්ඩායම් ක්‍රියාකාරකම්හි නියැලීමට අවස්ථාව සැලසීමට හැකි ඉගෙනුම් අවස්ථා සකස් කිරීම පිළිබද වැඩි අවධානයක් යොමු කළ යුතුය. එමගින් සන්නිවේදන ස්වරූප යන මාතෘකාව යටතේ සාකච්ඡා කෙරෙන පුද්ගලාන්තර සන්නිවේදනය පිළිබඳ අවබෝධය වර්ධනය කළ හැකිය.

(iii) අනුකොටසින් ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය අතර පවත්නා වෙනස්කම් තුනක් විස්තර කිරීම කිරීම අපේක්ෂා කර ඇති අතර එහි පහසුතාව 0.65කි. මෙම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී අදාළ විෂය කරුණු පිළිබද අපේක්ෂකයන් තුළ ප්‍රමාණවත් අවබෝධයක් පැවති බව සිතිය හැකිය. මේ පිළිබඳ ව තවදුරටත් ශිෂ්‍ය අවබෝධය හා කැමැත්ත ඇති කිරීම සඳහා ස්වයං අධ්‍යයන අවස්ථා ලබා දී ඒ ආශ්‍රිතව සමර්පන ඉදිරිපත් කිරීම, විවාද හා කථන අවස්ථා ද සිදු කළ හැකි යැයි යෝජනා කළ හැකිය.

ඔබ කැමති ජනමාධ්‍ය ඇසුරෙන් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග හතරක් නිදසුන් සහිතව පැහැදිලි කිරීම (iv) අනුකොටසින් අපේක්ෂා කර ඇත. මෙහි පහසුතාව 54%කි. ඒ අනුව අදාළ න්‍යායාත්මක කරුණු පිළිබඳව අපේක්ෂකයන් තුළ අවබෝධයක් පැවතිය ද, එය ප්‍රායෝගිකව භාවිත කිරීමට ඇති අවබෝධය ප්‍රමාණවත් නොවන බව කිව හැකිය. මේ සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ශිෂ්‍යයන්ට ප්‍රායෝගික අවබෝධය වර්ධනය කිරීම උදෙසා කණ්ඩායම් හා කේවල ක්‍රියාකාරකම් , සමර්පන ඉදිරිපත් කිරීම් ආදී ක්‍රමවේද භාවිත කිරීම උපයෝගී කර ගනිමින් පාඩම් සැලසුම් කිරීම යෝජනා කෙරේ.

### 3.3.3 ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂිත පිළිතුර

| |
|---|
| **2.** (i) ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණ **දෙකක** නම් කරන්න. |

1. මාධ්‍ය වෙළෙඳපොළක් නිර්මාණය කිරීම.
2. ග්‍රාහකයා පාරිභෝගිකයකු බවට පත් කිරීම.
3. පාරිභෝගික ආකර්ෂණය ඇති කිරීම.
4. ව්‍යාපාරික ආධිපත්‍යයක් ගොඩ නැගීම.
5. ජාතික සංස්කෘතික ධාරාවට අභියෝග කිරීම.
6. පහසුවෙන් රසවිඳිය හැකිවීම.
7. බුද්ධිමය, කලාත්මක හා සදාචාරාත්මක මට්ටම හීනවීම.
8. නිර්මාණවල ගුණාත්මකභාවය පිළිබඳ මිනුම් දණ්ඩක් ලෙස ක්‍රියාත්මක වීම.
9. සියලු ග්‍රාහකයා ගොදුරු කර ගැනීම.
10. මහා පරිමාණ නිෂ්පාදන බිහිවීම.
11. ජන මාධ්‍ය බහුලීකරණය (බහුලව බිහිවීම)
12. ව්‍යාජ මතවාද ප්‍රචලිත කිරීම.
13. තාක්ෂණික මෙවලම් හා බැඳි පැවතීම.
14. ගතිකත්වයකින් යුක්ත වීම.
15. මාධ්‍ය ඔස්සේ ව්‍යාප්ත වීම.

***ලකුණු 2 × 2 =***

| |
|---|
| **(ii)** මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය වන්නේ ඇයිදැයි හේතු **දෙකක්** දක්වමින් කෙටියෙන් විස්තර කරන්න. |

1. විවිධ මාධ්‍ය සංදේශ ලබා ගැනීමේ කැමැත්ත වැඩිවීම.
2. මානසික චර්යා පද්ධතිය පාලනය කර ගැනීමේ හැකියාව.
3. විවිධ මාධ්‍ය සංදේශ වඩාත් විචක්ෂණශීලිව උකහා ගැනීමේ පරිචය ලබා ගැනීම.
4. මාධ්‍ය සන්දේශ නිවැරදිව වටහා ගැනීම.
5. මාධ්‍ය හැසිරීම පිළිබඳ අවබෝධකර ගැනීම.
6. මාධ්‍ය ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය ලබා ගැනීම.
7. සන්දේශවල යටිපෙළ පිළිබඳ අවබෝධය ලබා ගැනීම.
8. මාධ්‍ය න්‍යාය පත්‍රය පිළිබඳ අවබෝධ කර ගැනීම.
9. මාධ්‍ය සංදේශවල අන්තර්ගතය විනිවිදව දැකිය හැකිවීම.
10. සන්දේශයේ නිර්මාණ කාර්ය වටහා ගැනීම.
11. මාධ්‍ය හිමිකාරීත්වයේ බලපෑම තේරුම් ගැනීම.
12. මාධ්‍ය පාලනය කිරීමට බලයක් ලැබීම.
13. දෛනික ජීවිතය යථාර්ථවාදීව ගොඩනගා ගැනීමට හැකිවීම.

***නම් කිරීමට ලකුණු 1 × 2 =***
***විස්තර කිරීමට ලකුණු 3 × 2 =***
***<u>මුළු ලකුණු -</u>***

| (iii) ග්‍රාම්-ඔස්ගුඩ් ආකෘතියේ ඇතුළත් ප්‍රධාන කරුණු **තුනක්** වෙන වෙනම පැහැදිලි කරන්න. |
|---|

- ආකේතකරය
- විකේතකරය
- පණිවිඩය
- අර්ථ නිරූපණය

***ලකුණු 4 × 3 = 12***

| (iv) ඔබ පාසලේ නව පුස්තකාල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. ඒ පිළිබඳව ප්‍රචාරණය සඳහා භාවිත කළ හැකි ජනශ්‍රුතිකාංග **හතරක්** නම් කර ඉන් **දෙකක්** අදාළ කාර්යය සඳහා යොදා ගතහැකි ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. |
|---|

- ජන කවි / ජන ගායනා / ජන ගී
- ජන කතා
- ජන නාට්‍ය / ජන රංග (කෝලම්, සොකරි, රූකඩ ...)
- ජන ක්‍රීඩා
- ජන නර්තන
- ජන සංගීතය
- ශාන්ති කර්ම සහ යතු කර්ම (දහ අට සන්නිය, රටයකුම කොහොඹා කංකාරිය)

(ප්‍රචාරණ කටයුතු සඳහා යොදාගත හැකි ආකාරය නිදසුන් ඇසුරෙන් විස්තර කර තිබිය යුතුය)

- තේමාව නිර්මාණය කර ගැනීම
- ප්‍රචාරණයට සුදුසු පරිදි යොදා ගැනීම
- ප්‍රචාරණයේ අරමුණු තහවුරු කිරීම.
- සේවාව ආකර්ශනීය ලෙස ඉදිරිපත් කිරීම.

***නම් කිරීම ලකුණු 1 × 4 = 04***
***නිදසුන් දැක්වීම ලකුණු 2 × 2 = 04***
***විස්තර කිරීම ලකුණු 4 × 2 = 08***
***<u>මුළු ලකුණු = 16</u>***

### 3.3.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.6**

ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය
ප්‍රශ්නය සඳහා ලකුණු 40 ක් හිමි වේ.




ඉන්
ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 41% ක්ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 33% ක්ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 19% ක්ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 6% ක්ද,
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 හෝ 20 ට අඩුවෙන් ලබා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 64%ක් වන අතර ලකුණු 31 හෝ 31ට වැඩියෙන් ලබා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 9% තරම් අඩු අගයක් ගනී.

මූලාශ්‍රය : RD/16/3/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 3.7**

ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

II පත්‍රයේ A කොටසේ දෙවන ප්‍රශ්නයේ අනුකොටස් හතරකි. මෙම ප්‍රශ්නය 74%ක අපේක්ෂක ප්‍රතිශතයක් තෝරාගෙන ඇති අතර සමස්ත පහසුතාව 55%කි.

(i) වන අනුකොටසින් ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණ දෙකක් නම් කිරීම අපේක්ෂා කර ඇති අතර පහසුතාව 76% කි. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේ දී අසා ඇති ප්‍රශ්නය පිළිබඳ පැහැදිලි අවබෝධයක් අපේක්ෂකයින් තුළ ඇති බව පෙනේ. මාධ්‍ය මගින් නිර්මාණය කර ඇති මෙම ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ අවබෝධය එම සංකල්පය ප්‍රායෝගික ව අත්දැකීමට හැකිවීම මගින් පහසුවෙන් අවබෝධ කර ගත හැකිය. මේ ආශ්‍රිත දැනුම හා අවබෝධය වර්ධනය කිරීම උදෙසා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා සැබෑ ජීවන අත්දැකීම් ආශ්‍රිතව උදාහරණ දැක්විය හැකිය. එමගින් වඩා වැඩි උත්තේජනයක් ඔස්සේ මෙම ලක්ෂණ සිසුන්ගේ අවබෝධය වර්ධනය කළ හැකිය. එහිදී කණ්ඩායම් ක්‍රියාකාරකම්, සමූහ සාකච්ඡා, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් සංවිධානය කිරීම ආදී වූ ක්‍රමවේද භාවිත කළ හැකිය.

(ii) අනුකොටසින් මාධ්‍යය සාක්ෂරතාව අවශ්‍ය වන්නේ ඇයිදැයි හේතු දක්වමින් කෙටියෙන් විස්තර කිරීම අපේක්ෂා කර ඇත. එහි පහසුතාව 64%කි. ඒ අනුව අදාළ විෂය කරුණු පිළිබඳව අපේක්ෂකයන්ගේ ප්‍රමාණවත් අවබෝධයක් පැවැති බව සිතිය හැකිය. තවදුරටත් මේ තත්ත්වය සංවර්ධනය උදෙසා විවිධ ප්‍රායෝගික අවස්ථා සඳහා පන්ති කාමර ඉගැන්වීම් කටයුතුවල දී සිසුන් යොමු කිරීම සිදු කළ හැකි වේ යැයි සිතිය හැකිය.

ග්‍රාම් ඔස්ගුඩ් ආකෘතියේ ඇතුළත් ප්‍රධාන කරුණු තුනක් වෙන වෙනම පැහැදිලි කිරීම අපේක්ෂිත (iii) අනුකොටසේ පහසුතාව 39%කි. ඒ අනුව ආකෘති පිළිබඳ බොහෝ අපේක්ෂකයන්ගේ ප්‍රමාණවත් අවබෝධයක් නොමැති බව පෙනී යයි. මේ සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුන්ගේ අවබෝධය වර්ධනය කිරීම උදෙසා නව තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඔස්සේ අදාළ න්‍යායාත්මක කරුණු පිළිබඳව සිසුන්ට අවබෝධයක් ලබාදිය යුතු බවට යෝජනා කෙරේ.

(iv) අනුකොටසින් තම පාසලේ නව පුස්තකාල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේ සැලසුම පිළිබඳව ප්‍රචාරණය සඳහා භාවිත කළ හැකි ජනශ්‍රැතිකාංග හතරක් නම්කර ඉන් දෙකක් අදාළ කාර්ය සඳහා යොදා ගත හැකි ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කිරීම අපේක්ෂා කරයි. එහි අදාළ කාර්ය සඳහා සුදුසු ජනශ්‍රැතිකාංග නම් කිරීම සඳහා අපේක්ෂකයින්ගේ පහසුතාව 79%ක් වුවද කරන ලද කොටස් විස්තර කිරීම පිළිබඳව පහසුතාව 16%කි. ඒ අනුව අදාළ න්‍යායාත්මක කරුණු නම් කිරීම පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය ප්‍රමාණවත් වුවද එය ප්‍රායෝගිකව අදාළ අවස්ථාවට අනුකූලව භාවිත කිරීමට ඇති අවබෝධය ප්‍රමාණවත් නොවන බව පෙනී යයි. මේ සඳහා පන්ති කාමරය තුළ සිදුකරන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී විවිධ ප්‍රායෝගික භාවිතයන්ට අදාළව ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට ශිෂ්‍යයන්ට සඳහා අවස්ථාව සලසා දිය යුතු අතර ගුරුවරයා විසින් එම පිළිතුරු පරීක්ෂා කර අවශ්‍ය උපදෙස් ලබා දී ශිෂ්‍යයන්ගේ අවබෝධය වර්ධනය කළ යුතු යැයි යෝජනා කරනු ලැබේ. එමෙන්ම පාඩම් සැලසුම් කිරීමේ දී ප්‍රායෝගිකත්වය මූලික කරගනිමින් අදාළ විෂය කරුණු කොටස් ඉගැන්වීම් සිදුකළ යුතු යැයි ද යෝජනා කෙරේ.

## 3.3.5 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර

3 සන්නිවේදන ක්‍රියාවලිය හඳුනාගැනීම ග්‍රාහක කුසලතාවකි.
(i) ග්‍රාමීය සංවර්ධනය සඳහා යොදා ගතහැකි ගුවන්විදුලි වැඩසටහන් ආකෘති **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

- ගුවන් විදුලි නාට්‍ය
- වාර්තාමය වැඩසටහන්
- සඟරාමය වැඩසටහන්
- සංගීත වැඩසටහන්
- අවධාරිත නිවේදන
- සාකච්ඡාමය වැඩසටහන්
- කතා වැඩසටහන්
- ගුවන් විදුලි විචිත්‍රාංග
- ප්‍රවෘත්ති
- වෙළෙඳ දැන්වීම්

***ලකුණු 1 × 4 = 04***

(ii) වර්තමාන ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වන වාරණ ක්‍රම **දෙකක්** විස්තර කරන්න.

- දැන්වීම් ලබාදීම පාලනය කිරීම.
- බලපත්‍ර නිකුත් කිරීම / අවලංගු කිරීම / පවරා දීම
- නීති අනපණත් හා බදු පැනවීම.
- නිසි බලධරයෙක් පත් කිරීම.
- ත්‍යාග සහ සංග්‍රහ ලබාදීම.
- මාධ්‍ය ආයතනවලට අලාභ හානි සිදු කිරීම / ගිනි තැබීම
- තනතුරු වළ වෙනස්කම් සිදු කිරීම.
- මාධ්‍යවේදීන්ට පහර දීම / තර්ජනය කිරීම / ජීවිත හානි සිදුවීම
- මාධ්‍ය ආචාරධර්ම.
- ස්වයං වාරණය.
- ප්‍රසිද්ධියේ නම් කිරීම.
- දඩ නියම කිරීම.
- දඬුවම් කිරීම.
- තහනම් කිරීම.

***ලකුණු 2 × 4 = 08***

(iii) මාධ්‍ය සංස්කෘතිය මගින් නිර්මාණය කරනු ලබන නව සමාජ අවශ්‍යතාවන්හි යහපත් හා අයහපත් බලපෑම් **දෙක** බැගින් වෙන වෙනම විස්තර කරන්න.

**<u>යහපත්</u>**

- නව ජීවන රටා ඇති කිරීම.
- සමාජය නවීකරණය වීම.
- ගෝලීය සංස්කෘතිය සමග යාවත්කාලීන වීම.
- නව සංස්කෘතිකාංග එකතු වීම.
- කාලීන අවශ්‍යතාවන්ට සංවේදීව කටයුතු කිරීම.
- නව මාධ්‍ය ආකෘති නිර්මාණය වීම.
- නිර්මාණශීලීත්වය වර්ධනය වීම.
- සංස්කෘතිය සමඟ දියුණු වී තිබීම.

**<u>අයහපත්</u>**

- සමාජ සම්බන්ධතා විසංවේදි වීම.
- අධිපරිභෝජන රටාවකට හුරුවීම.
- කෘත්‍රිම හා ව්‍යාජ අවශ්‍යතා නිර්මාණය.
- මානව සබඳතා යාන්ත්‍රිකරණය වීම.
- සමාජයේ සියලු ක්‍රියාකාකරකම් මාධ්‍යකරණයට ලක්වීම.
- සමාජ වටිනාකම්, චින්තනය, සංවේදිතාව, බුද්ධි මට්ටම් යනාදිය වෙළඳපොළ අවශ්‍යතාවයන්ට අනුගත වීම.
- සමාජ සංස්කෘතික විවිධත්වය හීනවීම.
- සංසකෘතික ආධිපත්‍ය හා කම්පනය ඇතිවීම.

***යහපත් බලපෑම් ලකුණු 3 × 2 = 06***
***අයහපත් බලපෑම් ලකුණු 3 × 2 = 06***
***මුළු ලකුණු = 12***

| |
|---|
| (iv) ආපදා අවස්ථාවකදී ජනමාධ්‍ය හැසිරවිය යුතු ආකාරය පහත කරුණු ඇසුරෙන් නිදසුන් සහිතව පහදන්න. |

1) **තොරතුරු කාර්යය**

- ක්ෂණිකව හා නිවැරදි වේලාවට තොරතුරු ලබාදීම.
- නිල මූලාශ්‍ර මත ලබාගත් තොරතුරු සැපයීම.
- අතිශය සංවේදී, භාවමය හැඟීම් ඇතිවන තොරතුරු ලබාදීමෙන් වැලකීම.
- පවත්නා තත්වයන් අඛණ්ඩව වාර්තා කිරීම.
- ඉදිරි තත්ව පිළිබඳ නිල මූලාශ්‍ර මත පදනම් වූ අනාවැකි පළ කිරීම.
- තොරතුරු සමබරව වාර්තා කිරීම.

2) **අධ්‍යාපන කාර්යය**

- ආපදාවේ අවධානම අවම කරගැනීමට දැනුවත් කිරීම.
- ආපදාවේ ස්වභාවය පැහැදිලි කිරීම.
- ආපදාවෙන් ආරක්ෂා වීමට ගතයුතු පියවර පිළිබඳ දැනුවත් කිරීම.
- උද්ගත වන අතුරු ප්‍රතිඵලවලින් ආරක්ෂා වීම පිළිබඳ දැනුවත් කිරීම.
- අහිමි වන ඉගෙනුම් අවස්ථා සම්පාදනය කිරීම.

3) **පෙළඹවීමේ කාර්යය**

- ජනතාව තුළ යහපත් චර්යාත්මක වෙනසක් ඇති කිරීම.
- බිඳ වැටුණු මානසිකත්වය යළි නගා සිටුවීම.
- එකිනෙකාට උපකාර කිරීමේ අවස්ථාවන් ඇති කිරීම.
- ආපදාවන්ට ලක්වූවන් කෙරෙහි නිසි බලධරයන්ගේ අවධානය යොමු කරවීම.

4) **සමාජ සංවිධාන කාර්යය**

- අන්‍යෝන්‍ය සහයෝගිතාව ගොඩ නැගීම.
- ජනමත / කතිකාවක් නිර්මාණය කිරීම.
- ක්ෂණික අවශ්‍යතා මතුවෙන් සමාජය සංවිධාන කිරීම (ආහාර / අවශ්‍ය ද්‍රව්‍ය)
- දිගු කාලීන සැලසුම් හඳුන්වා දීම.
- සුබ සාධන සේවාව ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය.

**(නිදසුන් සහිතව විස්තර කර තිබේ නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න)**

***නිදසුන් 2 × 4 = 08***
***විස්තර කිරීම 2 × 4 = 08***
***<u>මුළු ලකුණු = 16</u>***

### 3.3.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.8**

ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය
ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමි වේ.




ඉන්,
ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 41% ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 34% ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 18% ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 07% ක් ද,
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 හෝ 20ට අඩුවෙන් ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 75%ක් වන අතර ලකුණු 31 හෝ 31 ට වැඩියෙන් ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 7%ක් තරම් අඩු අගයක් ගනියි.

මූලාශ්‍රය : RD/16/3/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 3.9**

ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

II පත්‍රයේ A කොටසෙහි 3 වන ප්‍රශ්නය වන මෙහි අනුකොටස් හතරකි. මෙම ප්‍රශ්නය 29%ක අපේක්ෂක ප්‍රතිශතයක් තෝරගෙන ඇති අතර සමස්ත පහසුතාව 33%කි.

මෙහි (i) වන කොටසින් (13 ශ්‍රේණිය - සංවර්ධනය සඳහා සන්නිවේදනය - 9 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. ග්‍රාමීය සංවර්ධනය සඳහා යොදාගත හැකි ගුවන් විදුලි වැඩසටහන් ආකෘති හතරක් පිළිබඳ විමසා ඇති අතර එහි පහසුතාව 0.70කි. අපේක්ෂකයන්ට ගුවන්විදුලි ආකෘති පිළිබඳව ඇති අවබෝධය ප්‍රමාණවත් නොවන බව පෙනේ. ඒ අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහිදී ආකෘති, ප්‍රභේද යනාදී සංකල්ප පිළිබඳව කේවල වශයෙන් මෙන් ම එකිනෙක සංසන්දනය කරමින් නිවැරදි අවබෝධයක් ලබාදිය යුතු යැයි යෝජනා කළ හැකිය. පන්තිකාමරයට වඩා සුහුරු පන්තිකාමරය (Smart Classroom) හෝ පරිගණකාගාරය (Computer room) මෙවැනි පාඩම් ඉගැන්වීම සඳහා යොදාගැනීම මගින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැලෙමින් වැඩි ඵලදායීතාවකින් යුතුව අදාළ සංකල්ප ඉගැන්වීමේ හැකියාවක් පවතී.

(ii) කොටසෙහි (13 ශ්‍රේණිය - සන්නිවේදන ප්‍රතිපත්ති හා මාධ්‍ය නියාමනය - 10 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. වර්තමාන ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වන වාරණ ක්‍රම දෙකක් සහ ඒ පිළිබඳ කෙටි විස්තර කිරීමක් අපේක්ෂා කෙරේ. 13 ශ්‍රේණියට අදාළ විෂය නිර්දේශයේ 10 පාඩම මගින් මෙම විෂය කොටස් පන්තිකාමරයේ දී ඉගැන්වේ. නමුත් පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින් අදාළ සංකල්පය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබා ගෙන නොමැති බව පෙනේ. මෙවැනි සංකල්ප පන්තිකාමරය තුළ සාකච්ඡා කරන විට සමාජය තුළ ඇති විවිධ වාරණ අවස්ථා උදාහරණ ලෙස පෙන්වා දෙමින් ශිෂ්‍ය අවබෝධය වැඩි කළ යුතුය. උදාහරණ වශයෙන් පුවත්පත්, රූපවාහිනී ආදී ජනමාධ්‍ය තුළ වාරණය ක්‍රියාත්මක වන අවස්ථා පිළිබඳ ව පැහැදිලි කළ යුතුය. එහි දී වාරණය නිසා සිදුවන යහපත් හා අයහපත් ප්‍රතිඵල මෙන් ම වර්තමාන සමාජය තුළ වාරණය ලිහිල් කිරීම නිසා සිදු වී ඇති විවිධ ව්‍යසනයන් පිළිබඳව ද පුළුල්ව පැහැදිලි කළ යුතුය.

(iii) කොටසෙහි (12 ශ්‍රේණිය - සංස්කෘතිකාවබෝධය මාධ්‍යයේ ස්වභාවය සහ එහි බලපෑම - 5 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. මාධ්‍ය සංස්කෘතිය මගින් නිර්මාණය කරනු ලබන නව සමාජ අවශ්‍යතාවන් හී යහපත් හා අයහපත් බලපෑම් දෙක බැගින් වෙන වෙනම විස්තර කිරීම අපේක්ෂාකර ඇත. එහි අනුකොටස් දෙකක් පවතින අතර (I) අනුකොටස සඳහා 0.47ක පහසුතාවක් ද විස්තර කිරීමේ කොටස සඳහා පහසුතාව 0.27කි. මේ අනුව බොහෝ අපේක්ෂකයන්ට ප්‍රශ්නයට අදාළව න්‍යායාත්මක කරුණු දැනගත්ත ද විස්තර කිරීම සඳහා ප්‍රමාණවත් දැනුමක් නොමැති බව පෙනේ. ප්‍රශ්නයෙන් අසා ඇති කරුණුවලට අදාළ තත්ත්ව සමාජය තුළ නිරන්තරයෙන් දැකිය හැකිය. එවැනි අවස්ථා නිදසුන් තුළින් පෙන්වා දෙමින් ශිෂ්‍යයා පන්තිකාමරයේ දී අදාළ විෂය කරුණු හඳුනාගත හැකි සක්‍රීය පුද්ගලයෙකු බවට පත් කළ යුතු යැයි යෝජනා කෙරේ. තව ද, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ආදර්ශ ප්‍රශ්න පත්‍ර, පසුගිය ප්‍රශ්න පත්‍ර ආදියට හැකිතාක් පිළිතුරු සපයා ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමේ ශීල්පීය දක්ෂතා ද වර්ධනය කර ගත යුතු වේ.

(iv) කොටසෙහි (12 ශ්‍රේණිය - සන්නිවේදන පදනම - 2 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. ආපදා අවස්ථාවන්හිදී ජනමාධ්‍ය හැසිරවිය යුතු ආකාරය පිළිබඳ තොරතුරු කාර්යය, අධ්‍යාපන කාර්යය, පෙළඹවීමේ කාර්යය හා සමාජ සංවිධාන කාර්යය යනා දී ඇති කරුණු ආශ්‍රිතව නිදසුන් සහිතව පැහැදිලි කිරීමක් අපේක්ෂා කර ඇත. මෙය අනු කොටස් හතරකින් යුක්ත වන අතර පළමු අනු කොටසෙහි පහසුතා දර්ශකය 0.88කි. එය මෙම කොටසෙහි ඉහළ ම පහසුතා දර්ශකය යි. එහිදී විමසා ඇත්තේ තොරතුරු කාර්ය ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ ව වන අතර ඒ පිළිබඳ අපේක්ෂකයන් තුළ අවබෝධය සතුටුදායක මට්ටමක පවතින බව පෙනේ. එහෙත් අනෙකුත් දෙවන තුන්වන හා හතරවන අනු කොටස්වල පහසුතාව පිළිවෙළින් 0.32, 0.27 වේ. අවස්ථාව පිළිබඳව අපේක්ෂකයන්ට ප්‍රායෝගික ක්‍රියාත්මක දැනුමක් ලබා නොතිබීම මෙම කොටස සඳහා පහසුතාව අඩු වීමට හේතුවක් විය හැකිය.

මෙහිදී යම් සංසිද්ධියක් විග්‍රහ කිරීමේදී විවිධ පැතිකඩ ඔස්සේ එය පැහැදිලි කර ගැනීමෙහි වැදගත්කම පිළිබිඹු වේ. පන්ති කාමරය තුළ ශිෂ්‍යයන්ට මේ සංකල්ප පිළිබඳ ව නිසි අවබෝධයක් ලබාදීමට කණ්ඩායම් ක්‍රියාකාරකම් ලෙස සමාජයේ සිදුවන සුනාමි, ගංවතුර, නායයාම් හා වියළි කාලගුණික විපර්යාස ආදී විවිධ ආපදා අවස්ථා නිරීක්ෂණයට අවස්ථාව ලබා දී, එහිදී ජනමාධ්‍ය ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව සාමූහික හා කේවල ව්‍යාපෘති සකස් කිරීම වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදුකිරීමට අවස්ථාව ලබාදීම ආදිය සිදු කළ යුතු යැයි යෝජනා කෙරේ.

## 3.3.7 ප්‍රශ්න අංක 8 සහ අපේක්ෂිත පිළිතුර

**8.** තමා නුදුරේදී පැවැත්වීමට සැලසුම් කර ඇති චිත්‍ර ප්‍රදර්ශනය පිළිබඳ පුවත්පතකට සම්මුඛ සාකච්ඡාවක් ලබා දෙමින් අශේන් කියා සිටියේ ප්‍රදර්ශනය සඳහා අනුග්‍රහයක් අපේක්ෂාවෙන් සිටින බවයි.

(i) ලියනාඩෝ ඩාවින්චි විසින් දක්වා ඇති නිර්මාණශීලීත්වයේ මූලිකාංග **හතරක්** නම් කරන්න.

- දුර්ලභත්වය / කුතුහලය
- සුවිදර්ශය / නිරූපණය
- සංවේදනය
- සධුගමනය / මෘදුභාවය
- සම්බන්ධතාව
- කායික මානසික තුල්‍යතාව

*ලකුණු 1 × 4 = 04*

(ii) ආයතනයක් තම ප්‍රතිරූපය වර්ධනය කරගැනීමේදී ව්‍යාපාර මහජන සම්බන්ධතාවට අදාළව භාවිත කරන උපක්‍රම **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

- වෙළඳ වට්ටම් ලබාදීම.
- විශේෂ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.
- ආයතනික සමාජ වගකීම්, ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.
- වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම.
- අනුග්‍රහකත්වය ලබාදීම.
- මාධ්‍ය සම්බන්ධතා පැවැත්වීම.
- මාධ්‍ය ප්‍රචාරණ සිදුකිරීම.
- දෙස් විදෙස් සංචාර
- පුවත් හසුන

*ලකුණු 4 × 2 = 08*

(iii) චිත්‍ර ප්‍රදර්ශනය සඳහා සිද්ධි කළමනාකරුවෙක් යොදාගන්නේ නම්, එම අවස්ථාවට අදාළව ඔහු විසින් සිදුකළ යුතු කාර්යයන් **තුනක්** විස්තර කරන්න.

සිද්ධි තේමාව / ඉලක්ක හඳුනාගැනීම
- සැලසුම් කිරීම
- මූල්‍ය පිරිවැය හා එය සැලසුම් කිරීම
- ස්ථානය වෙන්කර ගැනීම
- ඉලක්ක කණ්ඩායම හඳුනා ගැනීම.
- ආරාධිතයින් තීරණය කිරීම.
- ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කිරීම.
- හදිසි අවස්ථා කළමනාකරණය
- ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් සැලසුම් කිරීම හා නිෂ්පාදනය කිරීම.

**(අවස්ථාවට අදාළව උක්ත කාර්යයන් විස්තර කළ යුතුය)**

*ලකුණු 4 × 3 = 12*

(iv) පුවත්පත් මාධ්‍යය තුළ නිර්මාණාත්මක භාෂා භාවිතය පහත අවස්ථාවලට අදාළව උදාහරණ දක්වමින් විස්තර කරන්න.
- සිරස්තල
- විශේෂාංග

**<u>සිරස්තල</u>**

- සරල භාෂාවක් භාවිතය
- කෙටි වැකි භාවිතය
- ආකර්ෂණීය භාෂාවක් යොදා ගැනීම.
- පෙළඹවීමක් සහිත භාෂාවක් වීම.
- කුතුහලය දනවන භාෂාවක් වීම.

**<u>විශේෂාංග</u>**

- තේමාවට අදාළව භාෂාව භාවිතය
- පාඨක අවධානයට හසුවන භාෂාවක් භාවිතය
- ආකෘතියට ගැළපෙන / යෝග්‍ය භාෂාවක් භාවිතය
- අන්තර්ගතය උද්දීපණය සඳහා රූපමය උදව් ලබා ගැනීම.
- ලේඛනයට අනුරූප භාෂාවක් භාවිත කිරීමේ හැකියව

**(එක් කොටසකට කරුණු 02 බැගින් උදාහරණ සහිතව ලියා තිබිය යුතුය)**

***උදාහරණ දැක්වීමට ලකුණු 1 × 4 = 04***

***විස්තර කිරීම ලකුණු 6 × 2 = 12***

***<u>මුළු ලකුණු 10</u>***

### 3.3.8 ප්‍රශ්න අංක 8 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.10**

ප්‍රශ්න අංක 8 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය
ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමි වේ.




ඉන්,
ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 33%ක්ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 30%ක්ද,
ලකුණු 31 - 30 ප්‍රාන්තරයේ 26%ක්ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 11%ක්ද,

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 හෝ 20ට අඩුවෙන් ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 63%ක් වන අතර ලකුණු 31 හෝ 31ට වැඩියෙන් ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 11%කි.

මූලාශ්‍රය : RD/16/3/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 3.11**

ප්‍රශ්න අංක 8 සඳහා පහසුතා




මූලාශ්‍රය : RD/16/4/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

B කොටසට අයත් 8 ප්‍රශ්නයෙහි අනුකොටස් හතරකි. මේ ප්‍රශ්නය 64% ක් අපේක්ෂක ප්‍රතිශතයක් තෝරාගෙන ඇති අතර සමස්ත පහසුතාව 51% කි. (ii) කොටසේ පහසුතාව 64% කි. එය එම ප්‍රශ්නයෙහි පහසුතාව වැඩිම ප්‍රශ්න අනුකොටස වෙයි. අඩුම පහසුතාවක් සහිත ප්‍රශ්න අනුකොටස වන්නේ (i) කොටසයි. එම පහසුතාව 39 %කි.

(i) අනුකොටසින් (13 ශ්‍රේණිය - නිර්මාණාත්මක සන්නිවේදනය - 7 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. ලියනාඩෝ ඩාවින්චි විසින් දක්වා ඇති නිර්මාණශීලීත්වයේ මූලිකාංග හතරක් නම් කිරීම අපේක්ෂා කරයි. න්‍යායාත්මක කරුණු පිළිබඳව විමසා ඇති අතර ඒ සම්බන්ධ විෂය කරුණු පිළිබඳව අපේක්ෂකයන්ගේ ප්‍රමාණවත් අවබෝධයක් නොමැති බව පෙනී යයි. පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නව තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් නිර්මාණාත්මක සන්නිවේදනය හ සම්බන්ධ පාරිභාෂිත වචන පිළිබඳ ආකර්ෂණීය ලෙස ප්‍රයෝගික නිදර්ශන එනම් නවකතා, කෙටිකතා, නිසඳැස්, පද්‍ය නිර්මාණ ආදී භාවිතයන් ඇසුරු කර ගනිමින් අවබෝධය තහවුරු කළ යුතුව ඇතැයි යෝජනා කෙරේ.

(ii) අනුකොටසින් (13 ශ්‍රේණිය - මහජන සම්බන්ධතා හා සිද්ධි කළමනාකරණය - 8 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. අපේක්ෂකයන් තම ප්‍රතිරූපය වර්ධනය කර ගැනීමේ දී ව්‍යාපාර මහජන සම්බන්ධතාවට අදාළව භාවිත කරන උපක්‍රම දෙකක් කෙටියෙන් විස්තර කිරීම අපේක්ෂිතය. එහි පහසුතාව 64%කි. ඒ අනුව අදාළ විෂය කරුණු පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂකයින්ගේ පැවැති බව පෙනී යයි.

(iii) අනුකොටසින් (13 ශ්‍රේණිය - මහජන සම්බන්ධතා හා සිද්ධි කළමනාකරණය - 8 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. චිත්‍ර ප්‍රදර්ශනය සඳහා සිද්ධි කළමනාකාරුවෙක් යොදා ගන්නේ නම් එම අවස්ථාවට අදාළව ඔහු විසින් සිදු කළ යුතු කාර්යයන් තුනක් විස්තර කිරීම අපේක්ෂා කරයි. එහි පහසුතාව 0.53කි. පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා විසින් මහජන සම්බන්ධතාව හා සිද්ධි කළමනාකරණය පාඩම සඳහා පාඩම් සැලසුම් සකස් කිරීමේදී දේශන සංවාද වීඩියෝ දර්ශන ක්ෂේත්‍ර චාරිකා ආදී ඉගෙනුම් ක්‍රමවේද භාවිත කිරීම හා නව තාක්ෂණික ක්‍රමවේද උපයෝගී කරගනිමින් ශිෂ්‍යයාට ආකර්ෂණශීලී ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම මගින් අදාළ විෂය කරුණු පිළිබඳව අවබෝධය තවදුරටත් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතු යැයි යෝජනා කෙරේ.

(iv) අනුකොටසින් (13 ශ්‍රේණිය - නිර්මාණාත්මක සන්නිවේදනය - 7 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. පුවත්පත් මාධ්‍ය තුළ නිර්මාණාත්මක භාෂා භාවිතය පිළිබඳව සිරස්තල හා විශේෂාංග යන අවස්ථාවලට උදාහරණ දක්වමින් විස්තර කිරීම (iv) අනුකොටසින් අපේක්ෂා කර ඇති අතර එහි පහසුතා දර්ශකය 0.49කි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සමර්පන ඉදිරිපත් කිරීම කණ්ඩායම් හා කේවල ක්‍රියාකාරකම් ආදී ඉගෙනුම් ක්‍රමවේද භාවිත කරමින් අදාළ විෂය කරුණු පිළිබඳව ශිෂ්‍ය අවබෝධය ප්‍රයෝගික භාවිතයන්ට නැඹුරුවන පරිදි පාඩම් සැලසුම් කිරීම මගින් සිදුකළ යුතු යැයි යෝජනා කෙරේ.

### 3.3.9 ප්‍රශ්න අංක 9 සහ අපේක්ෂිත පිළිතුර

9. ගෝලීය සංවර්ධන ගැටලු නව මානයක් ඔස්සේ අධ්‍යයනය කිරීමෙන් සන්නිවේදන ප්‍රවේශ වැඩිදියුණු කිරීමට අවස්ථාව උදාවෙයි.

(i) එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වන අන්තර් සම්බන්ධිත සංවර්ධනය සඳහා වන සන්නිවේදන ප්‍රවේශ **දෙකක්** නම් කරන්න.

- හැසිරීම් වෙනස්කම් සඳහා සන්නිවේදනය
- සමාජීය වෙනස්කම් සඳහා සන්නිවේදනය
- උපදේශනය / නියාමනය සඳහා සන්නිවේදනය
- පාරිසරික සමතුලිතතාවය සඳහා සන්නිවේදනය

*ලකුණු 2 × 2 = 04*

(ii) ග්‍රාමීය ප්‍රදේශවල පවත්නා සංවර්ධන ගැටලු හඳුනා ගැනීමේදී සමීක්ෂණ යොදාගැනීමේ වාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

- පවතින සැබෑ තත්වය අවබෝධ කරගත හැකිවීම.
- කෙටි කාලයකින් දත්ත රැස්කරගත හැකිවීම.
- දත්ත දායකයින් විශාල සංඛ්‍යාවකින් තොරතුරු රැස් කිරීමේ හැකියාව.
- පුළුල් පරාසයක තොරතුරු එකවර විමසීමේ හැකියාව.
- අවශ්‍ය නම් දුරස්ථව මෙහෙයවීමේ හැකියාව.
- මෘදුකාංග භාවිත කර හෝ ශ්‍රමායිකව දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය

*ලකුණු 4 × 2 = 08*

| | |
|---|---|
| **(iii)** | සංවර්ධනය සඳහා වන සන්නිවේදන ව්‍යාපෘතියක් සඳහා අදාළ ජන කණ්ඩායම වෙත ගොස් සිදුකරන සමීක්ෂණයකදී පිළිපැදිය යුතු ආචාරධර්ම **තුනක්** නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න. |

- සමීක්ෂණයේ ගුණාත්මක භාවය හා ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම.
- දත්ත හිතාමතා විකෘති නොකිරීම.
- වැරදි දත්ත ඇතුළත් නොකිරීම.
- දත්ත දායකයාගේ කැමත්ත මත පමණක් සමීක්ෂණය සඳහා සහභාගි කර ගැනීම.
- සමීක්ෂණය පිළිබඳ හා පර්යේෂණයේ මූලික අරමුණු පිළිබඳ දත්ත දායකයා දැනුවත් කිරීම.
- දත්ත දායකයාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම.
- නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම.
- දත්ත දායකයාගේ ආරක්ෂාව තහවුරු කිරීම.
- දත්ත ලබාගැනීමේ සමීක්ෂකයාගේ බලය අයුතු ලෙස යොදා නොගැනීම.

**(නිදසුන් සහිතව විස්තර කර තිබිය යුතුය)**

***උදාහරණ දැක්වීම ලකුණු*** *1 × 3 = 03*

***විස්තර කිරීම ලකුණු*** *3 × 3 = 09*

***<u>මුළු ලකුණු = 12</u>***

| | |
|---|---|
| **(iv)** | සංවර්ධන ක්‍රියාවලියේදී සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය යොදාගැනීමේ වැදගත්කම කරුණු **හතරක්** ඔස්සේ පැහැදිලි කරන්න. |

- ප්‍රජාතන්ත්‍රවාදී සවිඥාණිකත්වය ඉහළ දැමීම.
- ප්‍රජා සහභාගිත්වය වර්ධනය වීම.
- [illegible] දේශපාලන ක්‍රියාකාරීත්වය සක්‍රීය වීම.
- ජනයා අතර අන්තර්[illegible]කාරීත්වය සක්‍රීය වීම.
- පුරවැසියන් ඔවුන්ගේ මතවාද සම්බන්ධයෙන් දේශපාලඥයින් සමග ඍජුව සංවාදයට යොමුවීම.
- අනන්‍ය සන්නිවේදන භාවිතයන් සාම්ප්‍රදායික සන්නිවේදන බාධාවන් මගහරවා ගැනීමට භාවිත කිරීම.

***ලකුණු*** *4 × 4 = 16*

### 3.3.10 ප්‍රශ්න අංක 9 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.12**

ප්‍රශ්න අංක 9 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමි වේ.




ඉන්,
ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 54%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 13%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 4%ක් ද,
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 හෝ 20ට අඩුවෙන් ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 83%ක් වන අතර ලකුණු 31 හෝ 31ට වැඩියෙන් ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 4%ක් තරම් පහළ මට්ටමක් පවතී.

මූලාශ්‍රය : RD/16/3/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 3.13**

**ප්‍රශ්න අංක** 9 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ

9 වන ප්‍රශ්නය සඳහා අනුකොටස් හතරකි. 39%ක අපේක්ෂක ප්‍රතිශතයක් මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අතර එහි පහසුතාව 34%කි.

(i) කොටසින් (13 ශ්‍රේණිය - සංවර්ධනය සඳහා සන්නිවේදනය - 9 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. 9 ප්‍රශ්නයෙහි අඩුම පහසුතාවක් ඇත්තේ (I) කොටසයි. එහි පහසුතා දර්ශකය 0.17කි. එම ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වන අන්තර් සම්බන්ධිත සංවර්ධනය සඳහා වන සන්නිවේදන ප්‍රවේශ දෙකක් නම් කිරීමයි. එය අදාළ විෂය කරුණු පිළිබඳ ප්‍රයෝගික අවබෝධයක් ලබා දීම සඳහා ක්ෂේත්‍ර චාරිකා, ව්‍යාපෘති සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් දියත් කිරීම යෝජනා කළ හැකිය.

(ii) අනුකොටසින් (13 ශ්‍රේණිය - සංවර්ධනය සඳහා සන්නිවේදනය - 9 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. ග්‍රාමීය ප්‍රදේශවල පවත්නා සංවර්ධන ගැටලු හඳුනා ගැනීමේ දී සමීක්ෂණ යොදාගැනීමේ වාසි දෙකක් කෙටියෙන් විස්තර කිරීම අපේක්ෂා කර ඇත. සිසුන් තුළ මෙම විෂය කරුණු පිළිබඳ ව අවබෝධය වර්ධනය කිරීම උදෙසා පන්තිකාමරයේ දී ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. එහි දී පාඩම සඳහා ශිෂ්‍යන්ගේ ආකර්ශනය වැඩි කරමින් වැඩි ඵලදායීතාවකින් යුතුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කිරීම සඳහා නව තාක්ෂණික ක්‍රමවේද දියත් කිරීම මෙන් ම සහභාගීත්ව නිරීක්ෂණ ඔස්සේ ප්‍රයෝගික අත්දැකීම් ලබා ගැනීම සඳහා අවස්ථාව සැලසීම මගින් සිදු කළ හැකිය.

(iii) අනුකොටසින් (13 ශ්‍රේණිය - සංවර්ධනය සඳහා සන්නිවේදනය - 9 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. සංවර්ධනය සඳහා වන සන්නිවේදන ව්‍යාපෘතියක් සඳහා අදාළ ජන කණ්ඩායම් වෙත ගොස් සිදු කරන සමීක්ෂණයකදී පිළිපැදිය යුතු ආචාර ධර්ම තුනක් නිදසුන් ඇසුරෙන් විස්තර කිරීම අපේක්ෂා කර ඇත. යම්කිසි සංකල්පයකට අදාළ ආචාර ධර්ම පිළිබඳ න්‍යායාත්මක කරුණු පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට නම් එය ප්‍රායෝගිකව අත්දැකීම අනිවාර්ය වූවකි. නමුත් මෙහිදී අපේක්ෂකයන්ට එම ප්‍රායෝගික අත්දැකීම අවම මට්ටමක පැවතීම මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී අපේක්ෂකයන්ගේ සාධන මට්ටම අඩුවීමට හේතුවක් විය හැකිය. එබැවින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා සහභාගීත්ව නිරීක්ෂණ හා ක්ෂේත්‍ර චාරිකා ආදී ක්‍රමවේද භාවිත කිරීමෙන් වැඩි ඵලදායීතාවකින් යුක්ත ව අදාළ විෂය කරුණු පිළිබඳ අවබෝධය ලබා ගැනීමට යෝජනා කෙරේ.

මෙම ප්‍රශ්නයෙහි (iv) අනුකොටසින් (13 ශ්‍රේණිය - සංවර්ධනය සඳහා සන්නිවේදනය - 9 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. 0.20 ක අඩු පහසුතාව එම ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ සංවර්ධන ක්‍රියාවලීයෙහිදී සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය යොදා ගැනීමේ වැදගත්කම කරුණු හතරක් ඔස්සේ පැහැදිලි කිරීමයි. එහිදී නම් කිරීම සඳහා පමණක් ලකුණු ලබා නොදෙන අතර විස්තරාත්මකව පැහැදිලි කිරීමට පමණක් ලකුණු හිමිවේ. එබැවින් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ පුළුල් අවබෝධයක් නොමැති වීමත්, ලබා දී ඇති උපදෙස් නිසි පරිදි පිළිනොපැදීම නිසාත් අපේක්ෂකයන්ට සැලකිය යුතු ලකුණු ප්‍රමාණයක් අහිමි වී ඇත. එබැවින් පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ශිෂ්‍යයන්ට එම විෂය කරුණු පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීම කළ යුතු යැයි යෝජනා කළ හැකිය. ඒ සඳහා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම, නව තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ පාඩම් අධ්‍යයනය සඳහා සිසුන් යොමු කිරීම හා විවිධ කේවල හා සාමූහික ව්‍යාපෘති ආදිය දියත් කිරීමේ ප්‍රයෝගික අවස්ථා සඳහා සිසුන්ට සම්බන්ධ වීමට අවස්ථාව ලබාදීම තුළින් විෂය කරුණු තහවුරු කර ගැනීමට සහ සංවර්ධනය කිරීමට වැඩි අවකාශයක් ලබා ගත හැකිය.

## 3.3.11 ප්‍රශ්න අංක 10 සහ අපේක්ෂිත පිළිතුර

**10.** (i) අග්නිදිග ආසියාවේ ප්‍රථම ගුවන්විදුලිය බිහි වූ රට හා දශකය නම් කරන්න.

ශ්‍රී ලංකාව, 1920 දශකය

***ලකුණු 2 × 2 = 04***

(ii) සිනමා මාධ්‍යයේදී භාවිත වන පහත රූප රාමු යෝග්‍ය වන්නේ කවර අවස්ථාවන්හිදී ද යන්න පැහැදිලි කරන්න.

(a) මධ්‍යම රූපය

(b) දුර රූපය

**(a) මධ්‍යම රූපය**
චරිතයේ හෝ වස්තුවේ ලක්ෂණ නරඹන්නාට පැහැදිලි ලෙස දැක්වීම.

**(b) දුර රූපය**
සිදුවීම් පෙළක ආරම්භය සිදුවන ස්ථානය හෝ පරිසරය පිළිබඳ අවබෝධය නරඹන්නාට ලබාදීම.

**(උදාහරණ සහිතව විස්තර කර තිබිය යුතුයි)**
***ලකුණු 4 × 2 = 08***

(iii) අන්තර් සංස්කෘතික අවබෝධය ශක්තිමත් කර ගැනීම සඳහා සිනමා මාධ්‍යය භාවිත කළ හැකි ආකාරය ප්‍රධාන කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න.

- විවිධ සංස්කෘතීන් පිළිබඳ දැනුම, අවබෝධය ගොඩනැගීම.
- සංස්කෘතියක පවත්නා වටිනාකම් හා හර පද්ධතිය හඳුන්වා දීම.
- සංස්කෘතියට ආවේණික චර්යා රටා පෙන්නුම් කිරීම.
- සංස්කෘතික තුලනය සඳහා අවස්ථාව සැලසීම.
- සංස්කෘ[illegible] හුවමාරුව සඳහා අවකාශය සැලසීම.
- සංස්කෘතික විවිධත්වය පිළිබඳ අවබෝධය ගොඩනැගීම.
- සංස්කෘතික විවිධත්[illegible] කිරීමට පුහුණුවීම.
- අන[illegible]ංස්කෘතික සහයෝගිතාව ඇතිවී[illegible].

**(සිනමා මාධ්‍ය තුළ භාවිත කළ හැකි ආකාරය විස්තර කර තිබිය යුතුය)**
***ලකුණු 4 × 3 = 12***

| |
|---|
| (iv) සිනමා මාධ්‍යයේ නිර්මාණ සම්බන්ධයෙන් බුද්ධිමය දේපළ පනත වැදගත් වන අයුරු පහත සාධක ඇසුරෙන් සාකච්ඡා කරන්න.<br>(a) ආර්ථික අයිතිවාසිකම්<br>(b) සාධාරණ භාවිතය |

**(a) ආර්ථික අයිතිවාසිකම්**

- 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනතේ 6 වැනි වගන්තියට අනුව අයිතිවාසිකම් යන්න අර්ථ දක්වා ඇත.
- හිමිකරු ම පමණක් සිදුකිරීම හෝ සිදුකිරීමට බලාපොරොත්තු වන අංග ලෙස
- ප්‍රතිනිෂ්පාදනය • පරිවර්තනය • බෙදාහැරීම
- කුලියට දීම • ආනයනය හෝ අපනයනය කිරීම
- ප්‍රදර්ශනය කිරීම • විකාශනය • ප්‍රවර්ධනය
- ප්‍රචාරණය
- ආර්ථික අයිතිවාසිකමේ මුල් අයිතිය රඳා පවතින්නේ කතෘත්ව ස්වභාවය මතය.
- හවුල් නිර්මාණයක දී අදාළ පාර්ශව වලට ආර්ථික අයිතිවාසිකම් කතෘත්වය මත හිමි වේ.

**(a) සාධාරණ භාවිතය**

- හිමිකම් අයිතිය උල්ලංඝනය කිරීමක් නොවන අතර • විචාරය
- ප්‍රවෘත්ති වාර්තාකරණය • අධ්‍යාපන කාර්යය • ශිෂ්‍යත්ව
- පර්යේෂණ ආදී කාර්යය සඳහා යොදා ගැනීමට ඇති අවසරය.

**(සිනමා නිර්මාණයක් ඇසුරින් විස්තර කර තිබිය යුතුය)**
**(එක් කොටසකට කරුණු 02 බැගින් විස්තර කර තිබිය යුතුය)**
*ලකුණු 8 × 2 = 16*

### 3.3.12 ප්‍රශ්න අංක 10 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.14**

ප්‍රශ්න අංක 10 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

ප්‍රශ්නය සඳහා ලකුණු 40 ක් හිමි වේ.




ඉන්,
ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 56%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 12%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 4%ක් ද,
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 හෝ 20ට අඩුවෙන් ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 84%ක් වන අතර ලකුණු 31 හෝ 31ට වැඩියෙන් ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 4%ක් තරම් පහළ මට්ටමක පවතී.

මූලාශ්‍රය : RD/16/3/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 3.15**

ප්‍රශ්න අංක 10 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ

B කොටසෙහි 10 ප්‍රශ්නයෙහි පහසුතාව 38%කි. ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 37%කි. එම ප්‍රශ්නයෙහි වැඩිම පහසුතාවක් සහිත අනුකොටස වන්නේ, (ii) කොටසෙහි (a) කොටසයි. එහි පහසුතාව 0.65කි. අඩුම පහසුතාව සහිත අනුකොටස වන්නේ (iv) කොටසයි. එහි පහසුතාව 0.15කි.

(i) කොටසින් (12 ශ්‍රේණිය - සාම්ප්‍රදායික මාධ්‍ය හා ජනමාධ්‍ය, නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය - 4 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. අග්නිදිග ආසියාවේ ප්‍රථම ගුවන්විදුලිය බිහි වූ රට හා දශකය නම් කිරීම අපේක්ෂා කර ඇත. මෙහි පහසුතාව 30%කි. අපේක්ෂකයන් වැඩි ප්‍රමාණයකට එම විෂය කරුණු පිළිබඳ ව ප්‍රමාණවත් අවබෝධයක්නොමැති බව පෙනේ. එබැවින් පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් පාඩම අවසානයේ සමස්ත පාඩම ආවරණය වන පරිදි කෙටි ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට ශිෂ්‍යයන් හුරු කළ යුතුය. මේ ක්‍රමවේදය මාසික පරීක්ෂණ, විවෘත ග්‍රන්ථ පරීක්ෂණ හා කණ්ඩායම් ක්‍රියාකාරකම් ආදිය සඳහා ද යොදා ගත හැකිය.

(ii) කොටසින් (13 ශ්‍රේණිය - නිර්මාණාත්මක සන්නිවේදනය - 7 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. සිනමා මාධ්‍යයේ දී භාවිත වන මධ්‍යම රූප රාමු යෝග්‍ය වන අවස්ථා පැහැදිලි කිරීම සඳහා අපේක්ෂා කර ඇත. (ii) අනුකොටසේ (a) කොටසෙහි පහසුතාව 65%කි. අපේක්ෂකයන් වැඩි ප්‍රමාණයකට එම විෂය කරුණු පිළිබඳ ව ප්‍රමාණවත් අවබෝධයක් පවතින බව පෙනේ. මේ සම්බන්ධව තවදුරටත් සිසු අවබෝධය වර්ධනය කිරීමට ඡායාරූප ප්‍රදර්ශන හා වැඩමුළු පැවැත්වීම, සිනමා හා රූපවාහිනී රූගත කිරීම්හි රූපරාමු භාවිතය පිළිබඳ සහ කැමරා කෝණ පිළිබඳ ප්‍රායෝගික අවබෝධය ලබාදීම සුදුසු යැයි යෝජනා කෙරේ.

(iii) අනු කොටස (12 ශ්‍රේණිය - සංස්කෘතිකාවබෝධය මාධ්‍යයේ ස්වභාවය සහ එහි බලපෑම - 5 පාඩම) ඇසුරෙන් ලබා දී ඇත. අන්තර් සංස්කෘතික අවබෝධය ශක්තිමත් කිරීම සඳහා සිනමා මාධ්‍ය භාවිත කළ හැකි ආකාරය මෙම ප්‍රශ්න කොටසින් විමසා ඇත. එහි පහසුතාව 41%කි. මේ පිළිබඳ ශිෂ්‍ය අවබෝධය තවදුරටත් වර්ධනය කරගැනීම සඳහා විවිධ සංස්කෘතික ප්‍රභේද පිළිබඳ සහ ඒවාට ආවේණික සුවිශේෂී ලක්ෂණ පිළිබඳ සිනමා නිර්මාණ ටෙලි නාට්‍ය ඇසුරින් පැහැදිලි කිරීම වඩාත් සුදුසු යැයි යෝජනා කළ හැකිය.

මෙම ප්‍රශ්නයෙහි අඩුම පහසුතා දර්ශකය0.15කි. එය (iv) අනුකොටසෙහි (b) කොටස සඳහා (13 ශ්‍රේණිය - සන්නිවේදන ප්‍රතිපත්ති හා මාධ්‍ය නියාමනය - 10 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. සිනමා මාධ්‍යයේ නිර්මාණ සම්බන්ධයෙන්, බුද්ධිමය දේපල සාධාරණ භාවිතය සිදු කරන ආකාරය පිළිබඳ ව මෙම ප්‍රශ්නයෙන් විමසා ඇත. මේ සම්බන්ධයෙන් ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා ප්‍රතිපෝෂණ වැඩසටහන් සිදු කළ යුතුය. නිදර්ශන වශයෙන් පුස්තකාල භාවිතයට සිසුන් යොමු කිරීම, පර්යේෂණ කෘති සකස් කිරීමේ දී සහ යම් යම් පැවරුම්වලට අදාළ විෂය කරුණු භාවිතයේ දී කර්තෘ නාමය හා මූලාශ්‍රය සඳහන් කිරීමට ශිෂ්‍යයන් හුරු කළ යුතුය. එමෙන් ම අධ්‍යාපන කාර්යයන්හි දී අදාළ මාතෘකා සඳහා අවශ්‍ය කරුණු භාවිතයේ දී පරිශීලනය කරනු ලබන ග්‍රන්ථවල ඇතුළත් දත්ත සම්පූර්ණයෙන් ම පිටපත් කිරීම නොකළ යුතු බවත්, උපුටා ගැනීම් සිදු කිරීමේ දී පවතින සදාචාරමය හා නෛතිකමය තත්තවය පිළිබඳ ව ශිෂ්‍යයන් දැනුවත් කිරීමත් සිදු කළ යුතු බවට යෝජනා කෙරේ.

.

## 3.3.13 ප්‍රශ්න අංක 11 සහ අපේක්ෂිත පිළිතුර

11. මාධ්‍ය ක්ෂේත්‍රය තුළ කාලීනව ඇතිවන නව ප්‍රවණතා හේතුවෙන් ඊට අදාළ නියාමන හා ප්‍රතිපත්ති ද පළල් වී තිබේ.

(i) රටක මාධ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේදී අවධානය යොමු කළ යුතු සාධක **දෙකක්** ලියන්න.

- මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරීත්වය
- තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික සංවර්ධනය
- මහජනතාව සමඟ මාධ්‍ය සම්බන්ධතාව
- මාධ්‍ය අධිකාරිය හා වෙළඳපොළ නියාමනය
- නිරවද්‍යතාව, අපක්ෂපාතීත්වය හා සාධාරණත්වය පිළිබඳ අවධානය යොමු කිරීම.
- ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අවබෝධය, ප්‍රජා සම්බන්ධතා ප්‍රවර්ධනය, ප්‍රකාශන නිදහස, සහතික කිරීම හා ප්‍රජා සමගිය ප්‍රවර්ධනය කිරීම.
- මාධ්‍ය ආයතනවල කාර්යභාරය ස්වාධීන කිරීම හා ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය.

*ලකුණු 2 × 2 = 04*

(ii) ශ්‍රී ලාංකේය මාධ්‍ය ග්‍රාහක ක්ෂේත්‍රය ආශ්‍රිතව ඇති වී තිබෙන නව ප්‍රවණතා **දෙකක්** විස්තර කරන්න.

- නවීන තාක්ෂණය භාවිතයට වැඩි නැඹුරුවක් දැක්වීම.
- ග්‍රාහකයින් මාධ්‍ය අන්තර්ගතය නිර්මාණයට යොමුවීම.
- සාම්ප්‍රදායික මාධ්‍ය භූමිකාව වෙනස් වීම.
- මහ ජන ප්‍රවෘත්තිකරණය සඳහා යොමුවීම.
- විශේෂිත ක්ෂේත්‍ර නියෝජනය කරන ග්‍රාහක කණ්ඩායම් බිහිවීම.
- විවිධ ග්‍රාහක කණ්ඩායම් ලෙස බෙදී වෙන්වී යාම
- අසමාන හා විවිධත්වයෙන් යුතු ග්‍රාහක ක්ෂේත්‍ර බහුල වීම.
- ග්‍රාහක ක්ෂේත්‍රයේ අවශ්‍යතාව මත මාධ්‍ය ක්‍රියාත්මක වීම.
- බහු මාධ්‍ය පරිශීලනය

*ලකුණු 4 × 2 = 08*

(iii) මාධ්‍ය නියාමනය පිළිබඳ වගකීම දරන ආයතන **තුනක්** නම් කර ඒවායෙහි කාර්යභාරය පැහැදිලි කරන්න.

**<u>ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය</u>**

- සංදර්ශන, ප්‍රසංග හා චිත්‍රපට මහජන ප්‍රදර්ශනයට පෙර නිරීක්ෂණය කර ඊට අදාළ නියාමන කටයුතු සිදුකිරීම.
- 1912 ආරම්භ වී 1951 අංක 23 දරණ පණතින් මෙම ආයතනය ස්ථාපනය කොට ඇත.
- චිත්‍රපට සිනමා ශාලා වලට මුදා හැරීමේ දී නිකුත් කරන සහතිකයට U, X, A වර්ගීකරණය ලබාදීම.
- විවිධ මාර්ගෝපදේශයන්ට අනුගතව චිත්‍රපටවල දෙබස්, දර්ශන ඉවත් කිරීම.
- චිත්‍රපට පූර්ණ ලෙස වාරණය කිරීම.
- මණ්ඩලයේ සාමාජිකයින් පත්කිරීම විෂයභාර අමාත්‍යවරයා සිදුකරයි.

**<u>ශ්‍රී ලංකාවේ පුවත්පත් මණ්ඩලය</u>**

- [illegible] අංක 5 දරණ ශ්‍රී ලංකා පු[illegible]පාද මණ්ඩල පණත යට[illegible] [illegible]වත්වාගෙන යාම.
- මණ්ඩලය පිහිටුවීමේ අරමුණු
  1) පුවත්පත් වල වෘත්තීය තත්වය [illegible] නැංවීම
  2) පුවත්පත් නිදහස ආරක්ෂා කිරීම
  3) පුවත්පත් ආචාරධර්ම පවත්වාගෙන යාම
  4) පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
- මෙරට ප්‍රකාශයට පත්වන සෑම පුවත්පතක් ම වාර්ෂිකව මණ්ඩලයේ ලියාපදිංචි විය යුතුය.
- ප්‍රධාන විධායක නිලධාරියා එහි කොමසාරිස්වරයා ය.
- 1981 දී ප්‍රකාශයට පත්කර ඇති පුවත්පත් ආචාරධ[illegible]ලාවට අනුගතව ආචාරධර්ම කඩකිරීම පිළිබඳ පැමිණිලි සභාපතිවරයා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය විභාග කරයි.
- සභාපතිවරයා ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලය ජනාධිපතිවරයා පත්කරයි.

**<u>ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම</u>**

- 1996 අංක 27 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ පණත යටතේ ස්ථාපිත ආයතනයකි.
- විදුලි සංදේශ හා විදුලි සංදේශ කර්මාන්තය නියාමනය, මහජන අයිතිය ආරක්ෂා කිරීමයි.
- නව විදුලි සංදේශ ක්‍රමෝපායන් ප්‍රවර්ධනය
- ගුවන් විදුලි රූපවාහිනි විකාශ සංඛ්‍යාත පද්ධතිය බෙදාදීම.
- දුරකථන භාවිතයේ දී ග්‍රාහකයින්ට මතුවන ගැටලු පිළිබඳ පැමිණිලි කිරීම හා ඒට අදාළ මෙහෙයුම් කටයුතු සිදුකිරීම හා විසඳුම් ලබාදීම.
- සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය ජනාධිපතිවරයා විසින් පත්කරයි.
- සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත අධ්‍යක්ෂ ජනරාල්වරයා පරිපාලන කටයුතු සිදුකරයි.

**<u>ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම</u>**

- 2003 වර්ෂයේ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයට අනුබද්ධව පිහිටුවිය.
- ස්වයංනියාමන ආයතනයකි.
- ශ්‍රී ලංකා කතෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, පුවත්පත් ප්‍රකාශකයින්ගේ සංගමය ඒකාබද්ධව පිහිටුවා ඇත.
- ශ්‍රී ලංකා කතෘ සංසදය මගින් ප්‍රකාශයට පත්කර ඇති වෘත්තීය මාර්ගෝපදේශ සංග්‍රහය යටතේ ආචාර ධර්ම කඩකිරීම් පිළිබඳ පැමිණිලි කොමිසම වෙත ලබාදිය හැකිය.
- ලිඛිතව ලැබෙන පැමිණිලි පුවත්පත් වෙත යොමුකර කරුණු විමසා නිවැරදි කිරීමක් පළකිරීමට ඉල්ලුම් කිරීම කොමිසම මගින් සිදුකරයි.
- පැමිණිලි විභාග කිරීමට පුවත්පත් මාධ්‍ය හා වෙනත් ක්ෂේත්‍ර වල විද්වතුන්ගෙන් සමන්විත මණ්ඩලයක් පත්කර තිබේ.

**<u>ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය</u>**

- 2006 වසරේ ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය යටතේ පිහිටුවා ඇත.
- සමාජ මාධ්‍ය හා පරිගණක භාවිතය පිළිබඳ සොයා බැලීම.
- විවිධ සංවිධාන හා පුද්ගලයින් විසින් සිදුකරන සයිබර් අපරාධ සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීම.
- පරිගණක මගින් සිදුකරන වෙනත් අපරාධ, ත්‍රස්ත සංවිධාන වළ ක්‍රියාකාරීත්වයට එරෙහිව දැනුම්වත් කිරීම, අනතුරු ඇඟවීම, විසඳුම් ලබාදීම.
- පරිගණක ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් වන මහජන ගැටලු විමර්ශනය කර විසඳුම් ලබාදීම.

*නම් කිරීමට ලකුණු 1 x 3 = 03*

*විස්තර කිරීමට ලකුණු 3 x 3 = 09*

*<u>මුළු ලකුණු = 12</u>*

| |
|---|
| (iv) මාධ්‍ය ව්‍යවහාරය පදනම් කරගත් ප්‍රවණතා **හතරක්** නම් කර ඉන් **දෙකක්** පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න. |

1. **මාධ්‍ය අභිසාරීතාවය**
   අන්තර්ජාල තාක්ෂණය පාදක කොට සියලු මාධ්‍ය එකම සංඛ්‍යාංක වේදිකාවක් මතට ගෙනඒම.

2. **නිර්මහාපරිමාණකරණය**
   විශාල ග්‍රාහක කණ්ඩායම් ඉන් මිදි කුඩා කොටස්වලට වෙන් වී යාම.

3. **නිර්නියාමනය**
   පවතින නියාමන තත්ත්වය ලිහිල් කිරීම.

4. **පරිභෝජ්‍යකරණය**
   නිරන්තරව වර්ධනය වන භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීම සඳහා සමාජමය හා ආර්ථිකමය ක්‍රියාකාරකමකි.

5. **භාණ්ඩකරණය**
   තොරතුරු වෙළඳ භාණ්ඩයක් බවට පත්කර මාධ්‍ය මගින් අලෙවිකර මූල්‍ය ලාභ ලබා ගැනීම.

6. **වානිජකරණය**
   වෙළඳ දැන්වීම් කර්මාන්තය උපයෝගි කරගෙන මාධ්‍ය පද්ධතියේ ව්‍යුහය සහ ක්‍රියාකාරීත්වය ආර්ථික බලපෑම් මතින් ශක්තිමත් කිරීම.

7. **ගෝලීයකරණය**
   සන්නිවේදන මාධ්‍ය තාක්ෂණයේ දියුණුව සමඟ සියලු භාවිතයන් එක්තැන් වීම.

***නම් කිරීම ලකුණු*** *1 × 4 = 04*
***විස්තර කිරීමට ලකුණු*** *3 × 4 = 12*
***මුළු ලකුණු*** *= 16*

### 3.3.14 ප්‍රශ්න අංක 11 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.16**

ප්‍රශ්න අංක 10 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම සඳහා ලකුණු 40ක් හිමිවේ.




ඉන්,
ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 57%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 13%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 හෝ 20ට අඩුවෙන් ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 77%ක් වන අතර ලකුණු 31 හෝ 31ට වැඩියෙන් ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 10%ක් තරම් අඩු අගයක් ගනියි.

මූලාශ්‍රය : RD/16/3/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

**ප්‍රස්තාරය 3.17**

ප්‍රශ්න අංක 11 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/ALපත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ

B කොටසෙහි එකොළොස්වන ප්‍රශ්නය 41% අපේක්ෂක ප්‍රතිශතයක් තෝරා ගෙන ඇති අතර එහි සමස්ත පහසුතාව 39%කි.

මෙම ප්‍රශ්නයෙහි (i) කොටසෙන් (13 ශ්‍රේණිය - සන්නිවේදන ප්‍රතිපත්ති හා මාධ්‍ය නියාමනය - 10 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. රටක මාධ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේදී අවධානය යොමු කළ යුතු සාධක දෙකකි. වැඩි අපේක්ෂක සංඛ්‍යාවක් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් කරුණු මත පදනම්ව කටපාඩම් කර පිළිතුරු සපයා තිබුන ද එහි අන්තර්ගතය පිළිබඳ ව ඔවුනට වැඩි අවබෝධයක් ඇති බව දැකිය නොහැකිය. එබැවින් එවැනි පාඩම්වලදී සෑම විටම ගුරුවරයා එම කරුණු පිළිබඳව නිදසුන් සහිතව සරලව සහ පුළුල්ව විග්‍රහ කිරීම උචිත යැයි යෝජනා කළ හැකිය. එවිට ශිෂ්‍යයාට දිගුකාලීනව එම කරුණු මතකයේ රඳවා ගැනීමට පහසු වේ.

(ii) අනුකොටසෙහි පහසුතාව 32%කි. (ii) කොටසෙහි (13 ශ්‍රේණිය - සමකාලීන මාධ්‍ය ප්‍රවණතා - 11 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත.එම ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ ශ්‍රී ලාංකේය මාධ්‍ය ග්‍රාහක ක්ෂේත්‍රය ආශ්‍රිතව ඇති වී තිබෙන නව ප්‍රවණතා එතරම් සංකීර්ණය නොවුවද මෙම ප්‍රශ්නයෙහි පහසුතාව අඩු මට්ටමක පවතින්නේ ශිෂ්‍යයන්ගේ අවධානයට එම විෂය කොටස් යොමු වී නොතිබීම විය හැකිය.

(iii) අනුකොටසෙන් (13 ශ්‍රේණිය - සන්නිවේදන ප්‍රතිපත්ති හා මාධ්‍ය නියාමනය - 10 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. මාධ්‍ය නියාමනය පිළිබඳ වගකීම් දරන ආයතන තුනක් හා එහි කාර්යභාරය පිළිබඳව විමසා ඇත. එහි පහසුතාව 53%කි. එය ආයතන පිළිබඳ ව අධ්‍යයනයටඅපේක්ෂකයන් දක්වන කැමැත්ත සහ උනන්දුව එම ආයතන පිළිබඳ විවිධ තොරතුරු විමසීම ප්‍රශ්නයට අදාළ තොරතුරු ග්‍රහණය කර ගැනීමට ඉවහල් වූ බව සිතිය හැකිය. එහෙත් වර්ෂ, පනත් ආදී කරුණු පිළිබඳ ව දැනුම අවශ්‍ය බැවින් සිසුන්ට එම වර්ෂ පිළිවෙළින් දක්වා ඇති වගු ආදිය පන්ති කාමරය තුළ ප්‍රදර්ශනය කිරීම වැනි ප්‍රියජනක ඉගැන්වීම් ක්‍රමවේද යොදා ගැනීමට ගුරුවරයා තවදුරටත් යොමු කරවීම කළ හැකිය.

(iv) මේ අනුකොටසෙහි පළමු අනුකොටසට 0.55%ක පහසුතාවක් සහ දෙවන අනුකොටසට 0.11ක පහසුතාවක්ද ඇත. මාධ්‍ය ව්‍යවහාරය පදනම් කරගත් ප්‍රවණතා හතරක් නම් කර ඉන් දෙකක් උදාහරණ ඇසුරෙන් පැහැදිලි කිරීම (13 ශ්‍රේණිය - සමකාලීන මාධ්‍ය ප්‍රවණතා - 11 පාඩම) ඇසුරෙන් සකස් කර ඇත. මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර ඇත. එහි මෙහි පළමු අනුකොටස නම් කිරීම සඳහා වන අතර, එයට ඉහළ පහසුතාවක් ඇතත් උදාහරණ ඇසුරෙන් පැහැදිලි කිරීමේ ප්‍රශ්නවල පහසුතාව අඩු මට්ටමක පවතී. මේ අනුව එම කොටස් පිළිබඳ සරල අවබෝධයක් පැවතිය ද එහි ලක්ෂණ පිළිබඳ ව පුළුල් අවබෝධයක් දැක්වීමට ප්‍රමාණවත් දැනුමක් බොහෝ අපේක්ෂකයන්ට නොමැති බවයි. මේ සඳහා වර්තමාන ලෝකයේ ප්‍රායෝගික අවස්ථා නිදසුන් ලෙස යොදා ගනිමින් එම සංකල්ප පිළිබඳ ප්‍රියජනක ලෙස සවන් දීමට යොමුවන සේ පන්ති කාමරය තුළ ගුරුවරයා උපායශීලීව ක්‍රියා කිරීම කළ යුතු යැයි යෝජනා කළ හැකිය.